## ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

# වාර්ෂික වාර්තාව 2012

srilanka

WONDER OF ASIA



ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

# වාර්ෂික වාර්තාව 2012



# පටුන

පිටුව


ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පණිවුඩය ..... 02

දැක්ම හා මෙහෙවර ..... 03

ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ පණිවුඩය ..... 04

ආයතනික තොරතුරු ..... 05

සභාපතිතුමාගේ පණිවුඩය ..... 06

කළමනාකරණ මණ්ඩලය ..... 07

කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය ..... 08

සංඛ්‍යාන විග්‍රහය ..... 10

අලෙවි හා ප්‍රවර්ධනය ..... 14

වැඩසටහන් ..... 26

මහජන සම්බන්ධතා හා මාධ්‍ය ප්‍රචාරණය ..... 29

ශ්‍රී ලංකාව පිළිබඳ ජාත්‍යන්තර නියමයන් ..... 32

මූල්‍ය වාර්තාව 2012 ..... 33

විගණන වාර්තාව ..... 44



ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ
අතිගරු ජනාධිපති

## මහින්ද රාජපක්ෂ මැතිතුමා

“සංචාරක කර්මාන්තය සඳහා
කඩිනම් සංවර්ධන වැඩසටහනක්
හඳුන්වා දෙන්නෙමි.
ඒ යටතේ 2016 වර්ෂය වන විට
වසරකට සංචාරකයන් ලක්ෂ 25 ක්
මෙරටට ගෙන්වා ගැනීමට අවශ්‍ය වන
යටිතල පහසුකම් හා
අනෙකුත් අවශ්‍යතා සපුරාලන
වැඩපිළිවෙළක් දියත් කරන්නෙමි.”

(මහින්ද චින්තන ඉදිරි දැක්ම 2010, පිටුව 90)

# දැක්ම

'ශ්‍රී ලංකාව, එහි වූ සුන්දර වෙරළ තීර, උණුසුම් සහ සුහදශීලී ජනතාව සහ එය සතු අග්‍රගණ්‍ය ස්වාභාවික, සංස්කෘතික සහ වික්‍රමාන්විත අත්දැකීම් සමග, ආසියාවේ සංචාරක සන්ධිස්ථානය බවට පත්කර, එය සංචාරක කර්මාන්තයේ පාර්ශ්වකරුවන් සඳහා මෙන්ම, ශ්‍රී ලංකාවාසී ජනතාවට ද ප්‍රතිලාභ ලබා දෙන විශාලතම විදේශ විනිමය උපයන්නා වශයෙන් සංවර්ධනය කර, ශ්‍රී ලංකාව ආසියාවේ ප්‍රමුඛතම සහ හරිත වර්ණයෙන් සපිරුණු දිවයිනක් වශයෙන් ස්ථාපනය කොට ස්ථානගත කිරීම.'

# මෙහෙවර

- අත්‍යවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ඉහළ නැංවීම සහ නඩත්තු කිරීමෙහිලා දායක වීම
- සංචාරකයන්ගේ සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව පිළිබඳව අවධානය යොමු කරමින්, සංචාරකයන් සන්තුෂ්ටියට සහ ප්‍රමෝදයට පත්කිරීම අරමුණු කොටගත්, ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු නිෂ්පාදන ස්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම.
- සංචාරක කර්මාන්තයට කෙරෙන ආයෝජන පරිමාණය සහ ඒවායේ තිරසරභාවය පවත්වාගැනීම සඳහා සංචාරකයන් උත්පාදනය කෙරෙන ප්‍රමාණය සහ එහි ධාරිතාව තහවුරු කිරීම.
- කාබන් විමෝචනය අවම කර, ශ්‍රී ලංකාව ශක්‍යතාවයක් සහිත පාරිභෝගිකයන් අතර ඉහළ පිළිගැනීමක් සහිත ප්‍රමුඛ දිවයිනක් බවට පත්කිරීම.
- වෘත්තීමයභාවය, නිපුණතා සංවර්ධනය සහ පුහුණුවීම් සංවර්ධනය මගින් කර්මාන්තයේ මානව සම්පත් අවශ්‍යතා සපුරා ගැනීම.
- ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම උදෙසා, කර්මාන්තය තුළ මෙන්ම, කර්මාන්තයෙන් බාහිරව සිටින්නා වූ නිල මෙන්ම, නිල නොවන අංශ නියෝජනය කරන්නා වූ ද සියලු පාර්ශ්වකරුවන් සහභාගි කරවා ගැනීම.
- ශ්‍රී ලාංකිකයන්ගේ ගමනාගමන අවශ්‍යතා සඳහා ලබාදෙන සේවය වැඩිදියුණු කරමින්, දේශීය සංචාරක කර්මාන්තය පුළුල් කරමින්, එනයින් ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.



"සාමය ස්ථාපිත වීමෙන් අනතුරුව අසිරිමත් දේශයක් ලෙස ගොඩනැගෙමින් පවත්නා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය 2016 වසර වන විට රටේ ආර්ථිකයට ඉමහත් දිරියක් ජවයක් සපයන බව මට නිසැකය. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් මානව සම්පත් හා සේවා ප්‍රමිතීන්ද වැඩිදියුණු කිරීමට අමතරව, ශ්‍රී ලංකාවට ආවේණික ආගන්තුක සත්කාරයේ හා සුහදශීලී සිනහවේ මහිමයෙන් සංචාරකයින් වඩ වඩාත් ආකර්ෂණය කර ගැනීම සඳහා මංපෙත් විවර කරලීම මාගේ උත්සාහයයි.

මේ සියලු ව්‍යායාමයන් ඔස්සේ මහින්ද චින්තනය වඩාත් අර්ථවත් කිරීම හා ඔප්නැංවීම මාගේ අභිලාෂයයි."

## ආර්ථික සංවර්ධන අමාත්‍ය
## ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ පවතින සාමය හා සමගිය සමග සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකා ආර්ථිකය වැඩිදියුණු කිරීමේ ප්‍රධාන කර්මාන්ත අතුරින් එකක් ලෙස හඳුනාගෙන ඇත.

"2011 - 2016 සංචාරක සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම" ක්‍රියාවට නංවන ලද අතර, ඒ අනුව සමස්ත සංචාරක ක්ෂේත්‍රයේ ආදායමේ 23.6%ක වර්ධනයක් විදේශ විනිමය හරහා උපයා ඇති බව නිරීක්ෂණය කර ඇත. 2012 දෙසැම්බර් මාසයේදී මිලියන එකක සංචාරක පැමිණීම් සමග මින් පෙර වසර 46කට ළඟාකර ගත නොහැකි වූ ඇමරිකානු ඩොලර් බිලියන 1.038ක ආදායමක් ළඟාකර ගන්නා ලදී.

2013 වසරේදී සංචාරක පැමිණීම් හරහා මිලියන 1.3ක ඉලක්කයක් ළඟාකර ගැනීමට බලාපොරොත්තුවන අතර, එය 2016 දී මිලියන 2.5කි. පෙර වසර හා සැසඳීමේදී සංචාරක පැමිණීම් 17.5% කින් වැඩි වී අතර, 1,005,605ක් වන එය ළඟා විය හැකි යථාර්ථවාදී ඉලක්කයක් විය.

ශ්‍රී ලංකාව ඒකීය රටක් ලෙස ඉතා වේගයෙන් දියුණුවන මෙම සංචාරක කර්මාන්තයේ බොහෝ ප්‍රතිලාභයන් සහ උත්පාදනය වන සියලු ආදායම් රටේ ජනතාව වෙත ලබාදිය යුතු ආකාරය පිළිබඳව, මේ වන විටත් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇත. මෙම ප්‍රතිලාභයන් වන නව රැකියා අවස්ථාවන් ප්‍රාදේශීය ජනතාව සහ බොහෝ වෙනත් සෘජු සහ වක්‍ර ප්‍රතිලාභ හා එක් වූ ප්‍රාදේශීය ව්‍යවසායකින් සහ යටිතල පහසුකම් සංවර්ධනයන් හා ඒකාබද්ධව පවතී.

සංචාරක උපායමාර්ගයන් සමග සංචාරක ව්‍යාපාරයේ වැඩි දියුණුව සඳහා නිරතුරුව සහයවෙමින් සංචාරක කර්මාන්තය වැඩිම විදේශ විනිමය උපයන කර්මාන්තය බවට පත්කිරීම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මුඛ්‍ය අරමුණ වේ.

# ආයතනික තොරතුරු



**ආයතනයේ නම :** ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

**නීතිමය ස්වභාවය :** වර්ෂ 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ සංස්ථාපිත ආයතනයකි. (වර්ෂ 2005 අංක 38 දරන නව සංචාරක පනත බලාත්මක වූයේ 2007 වසරේ ඔක්තෝබර් මස 01 වන දින සිටය. අංක 38 දරන සංචාරක පනත මගින් වර්ෂ 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත අහෝසි කරනු ලැබීය. ඒ අනුව, 2007 වසරේ සැප්තැම්බර් මස 30 වන දින සිට ක්‍රියාත්මක වූ පරිදි, ලංකා සංචාරක මණ්ඩලයේ මෙහෙයුම් අත්හිටුවන ලදී. එවකට පැවැති සංචාරක මණ්ඩලයේ සංචාරක ප්‍රවර්ධන කටයුතු ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය යටතට ගැණින.)

**සන්නාම සලකුණ සහ තේමා පාඨය :** srilanka WONDER OF ASIA

**කාර්යාල :** ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත්තේ, කොළඹ 03, ගාලු පාර, අංක 80 දරන ස්ථානයේය (බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ, කටුනායක, මහනුවර සහ සීගිරිය යන ස්ථානයන්හි සංචාරක තොරතුරු මධ්‍යස්ථාන ස්ථාපනය කර ඇත)

**විගණනය කිරීම :** ශ්‍රී ලංකා විගණකාධිපති

**බැංකුකරු :** ලංකා බැංකුව

**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ භූමිකාව :** ශ්‍රී ලංකා සංචාරක අත්දැකීම් සඳහා තිරසර ජාත්‍යන්තර ඉල්ලුම පවත්වා ගැනීම සහ,

- පැහැදිලි ගමනාන්ත අලෙවිකරණ ක්‍රමෝපායක් සකස්කිරීම සහ එය සාර්ථකව ක්‍රියාත්මක කිරීම;
- තරගකාරීත්වය තුළින් නිතරගයෙන් ක්‍රමෝපායිකව ඉස්මතුවන, ආකර්ෂණීය ගමනාන්ත වෙළඳ නාමයක් නිර්මාණය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ස්ථාපනය කිරීම;
- සාම්ප්‍රදායික සහ අන්තර්ජාලය ඔස්සේ ඉස්මතුවන බෙදාහැරීමේ ජාලයන්ට සහය වෙමින් සහ ඒවා යොදා ගනිමින්, සංචාරකයන් පැමිණීමේ සහ ඉපැයීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස අලෙවිකරණ සම්පාදනය;
- ඉලක්කගත වෙළඳපොළ කොටස්වල අවශ්‍යතා සහ අපේක්ෂාවන්ට අනුව ශ්‍රී ලංකාවට ආවේණික වූ සංචාරක අත්දැකීම් හඳුනාගැනීම සහ සහය වීම;
- ශ්‍රී ලංකා සංචාරක නිෂ්පාදන, සේවා සහ එකී වෙළඳ නාමයේ සියලු කොටස් වෙළඳ නාමයට මෙන්ම වෙළඳනාම ස්ථානගත කිරීමේ ක්‍රමෝපායන්ට සරිලන්නේ යැයි තහවුරු කිරීම;
- වඩාත් හොඳ තීරණ ගැනීම සඳහා, ප්‍රමුඛ පෙළේ සියලු වෙනස්කම් සහ ප්‍රවණතා ඒකරාශි කරමින් වෙනස්වන ජාත්‍යන්තර සංචාරක කර්මාන්ත පසුබිම අධ්‍යයනය කරමින්, ව්‍යාපාර සැලසුම් සහ සංවර්ධනය කිරීම පිණිස, ඒවා අදාළ කර්මාන්ත පාර්ශ්වකරුවන් වෙත දැන්වීම ; සහ
- ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සම්පාදනය කළ හැකි සහ සහය විය හැකි ආයතන සමග සමීපව කටයුතු කිරීම.

මගින් ශ්‍රී ලංකා සංචාරක නිෂ්පාදනය ලබාදීමේදී සහ එකී සංචාරක කර්මාන්තයේ පාර්ශ්වකරුවන් වෙත සහ ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ප්‍රතිලාභ ලබාදීමේදී, ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය වෙත උද්යෝගීභාවය, ඒකරාශීවීම සහ සහයෝගය ලබාදීම.

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විමසමින්, සංචාරක සංවර්ධන සැලසුමට අනුකූලව, ගුණාත්මකභාවයෙන් යුතු ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාව සෘජුව හෝ වක්‍රව අලෙවි සහ ප්‍රවර්ධනය කිරීම.
- ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපයට දොරටුවක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම
- ශ්‍රී ලංකාව කලාපීය විශිෂ්ට සංචාරක සංවර්ධන සහ කළමනාකරණ කේන්ද්‍රස්ථානයක් වශයෙන් කීර්තියට පත්කිරීම



# සභාපතිතුමාගේ පණිවුඩය

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආශීර්වාදයත්, ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මගපෙන්වීමත් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මැතිතුමාගේ උපදේශන සහය මත සංචාරකයින් 1,005,605ක් වූ මිලියනයකට අධික ප්‍රමාණයක් මෙරටට පැමිණීමෙන්, 2012 වසර ශ්‍රී ලංකා සංචරණය අභිමානයේ ඉතා වැදගත් සංධිස්ථානයක් වෙත ළඟා වූ වසරකි. ඒ අනුව, ශ්‍රී ලංකා සංචරණයේ අපහට ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ වර්ධනය සඳහාත්, රටේ ආර්ථිකය දියුණුකිරීම සඳහාත්, දායකත්වයක් ලබාදීමට හැකිවීම මහත් ගෞරවයකි.

සංචාරක උපායමාර්ගයන් ක්‍රියාවට නැංවීම සහ රජයේ අරමුණු ඉටුකිරීම උදෙසා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය බැඳී සිටින අතර, එතුළින් ශ්‍රී ලාංකිකයින්ගේ අපේක්ෂාවන් සැපිරීම බලාපොරොත්තුවයි.

රජයේ අරමුණ වන 2016 වනවිට රටේ විශාලතම විදේශ විනිමය උපයන්නා ලෙස සංචාරක කර්මාන්තය පත්කිරීමට පහසුකම් සලසනු ලබයි. 2012 වසරේදී ශ්‍රී ලංකා සංචරණය විසින් ඇමරිකානු ඩොලර් බිලියන 1.038ක් උපයා ඇති අතර, එය පසුගිය වසර හා සැසඳීමේදී 23.6%ක වැඩිවීමකි.

මූල්‍ය කාර්යසාධන දත්ත අනුව ලෝකයේ හොඳම ගමනාන්ත අතුරින් එකක් බවට ශ්‍රී ලංකා සංචරණය බොහෝ පිළිගත් මූලාශ්‍ර හරහා විශාල ප්‍රශංසා ලබාගෙන ඇත.

සංචාරකයින් සඳහා ධනාත්මක උපාය මාර්ගයන් සහ පැහැදිලි උපදේශනයන් යනාදී පහසුකම් සැපයීම සහ පවතින හෝටල් කාමර 5.68%ක සැලකිය යුතු වර්ධනයක් සමග 2016 වසර වනවිට සංචාරකයින් මිලියන 2.5ක් ගෙන්වාගැනීමේ අරමුණ ඇතිව බොහෝ යටිතල පහසුකම් සහ පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති ආරම්භ කර ඇත.

ඉහළයමින් පවතින ලෝක ව්‍යාප්ත තරගකාරිත්වය ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයට බරපතල තර්ජනයන් නිරන්තරයෙන් පෙන්වා දෙන අතර, 2011 වසරේ සංචාරකයින් පැමිණීමේ 17.5%ක වර්ධනය අනාගතයේදී ඉහළ අරමුණක් කරායෑමට ස්ථිර මගපෙන්වීමක් තහවුරු කරයි.

අවසාන වශයෙන් සංචරණයේ ප්‍රතිලාභ ජනතාව වෙත ලැබීමටත්, රටේ සමාජයීය වටිනාකම් හෝ පරිසරයට අවදානමක් නොවන ලෙස සංචරණ ප්‍රතිපත්ති තීරණය කරනු ඇත. ඒ අනුව, මෙම අත්‍යාවශ්‍ය ප්‍රධාන සාධක සෑම ක්‍රියාකාරකමකදීම යොදා ගනිමින් සංචාරක කර්මාන්තය සංවර්ධනය උදෙසා පියවර ගෙන ඇත.

බලාපොරොත්තුවන තත්වය සහ අරමුණු ළඟාකර ගැනීමට කර්මාන්තයේ සියලුම සංවිධාන සහ කොටස්කරුවන් සමග නිරන්තරයෙන් ක්‍රියාකරනු ලබන අතර, ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත්කිරීමට අවශ්‍ය ශක්තිය සහ කර්මාන්තය වැඩිදියුණු කිරීමට අවශ්‍ය පහසුකම් සහ උපකාරයන් ලබාදීමේ හැකියාවක් අපහට ඇති බවට විශ්වාස කරමු.

භාෂ්වර සේනාංක ගුණරත්න

# කළමනාකරණ මණ්ඩලය

**ජ්‍යෙෂ්ඨ කළමනාකරණය**

| තනතුර | නම | වත්මන් ධුරයේ සේවා කාලය - සේවා ආරම්භක හා අවසාන දිනය |
|---|---|---|
| සභාපති | ආචාර්ය නාලක ගොඩහේවා | 2010 ජූනි සිට 2012 මැයි දක්වා |
| සභාපති | බී.එස්. ගුණරත්න මහතා | 2012 ජූනි සිට 2012 දෙසැම්බර් දක්වා |
| කළමනාකරණ අධ්‍යක්‍ෂ | රූමි ජවුෆර් මහතා | 2011 මැයි සිට 2012 දෙසැම්බර් දක්වා |
| අලෙවි අධ්‍යක්‍ෂ | මධුභානි පෙරේරා මෙනෙවිය | 2008 ජනවාරි සිට 2012 දෙසැම්බර් දක්වා |

**කළමනාකරණ මණ්ඩලය**

| තනතුර | නම | වත්මන් ධුරයේ සේවා කාලය - සේවා ආරම්භක හා අවසාන දිනය |
|---|---|---|
| සභාපති | ආචාර්ය නාලක ගොඩහේවා | 2010 ජූනි සිට 2012 මැයි දක්වා |
| සභාපති | බී.එස්. ගුණරත්න මහතා | 2012 ජූනි සිට 2012 දෙසැම්බර් දක්වා |
| මණ්ඩල සභික | ආචාර්ය බී.එම්.එස්. බටගොඩ | 2010 ජූනි සිට 2012 දෙසැම්බර් දක්වා |
| මණ්ඩල සභික | එම්.කේ.බී. දිසානායක මහතා | 2012 ජූනි සිට 2012 ජූලි දක්වා |
| මණ්ඩල සභික | නිල්මිනි නානායක්කාර මහතා | 2010 ජූලි සිට 2012 දෙසැම්බර් දක්වා |
| මණ්ඩල සභික | මර්වින් ප්‍රනාන්දුපුල්ලේ මහතා | 2010 ජූලි සිට 2012 දෙසැම්බර් දක්වා |





# කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2012 වාර්ෂික වාර්තාව ඔබ අතට පත් කිරීමට මා ලද මේ අවස්ථාව සතුටක් මෙන්ම භාග්‍යයක් ලෙස සලකමි.

ශ්‍රී ලංකාවට පළමුවරට සංචාරකයින්ගේ පැමිණීමේ දශලක්ෂයේ සීමාව පසුකරමින් 2012 වසරේ දී සිය සංචාරක කර්මාන්තයේ වැදගත් සංධිස්ථානයක් පසුකරන ලදී. එය 2011 වසරේ සංචාරක පැමිණීම හා සසඳන විට 17.5% ක ඉතාම කැපී පෙනෙන වර්ධනයකි. 2012 වසර, මෙරට සංචාරක ක්ෂේත්‍රයේ දියුණුව කරා ඉතා වේගයෙන් ගමන් කළ, එමෙන්ම ජයග්‍රහණ රැසක් අත්පත් කරගත් වසරක් ලෙසද සැලකිය හැකිය.

2012 වසර හා සසඳන විට, මේ වසරේදී , අප සංචාරක හා වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගීවීමේ ඉහළ වර්ධනයක් පෙන්වා ඇත. එහිදී පෞද්ගලික අංශයේ සංචාරක නියෝජිතයන් හා හෝටල්කරුවන් ද අප හා එක් වූ බව කිව යුතුය. පුද්ගලික අංශය සමග මෙම සහයෝගිතාව අපේ දියුණුවට ප්‍රධාන හේතුවයි. එමෙන්ම සංචාරක ක්ෂේත්‍රයේ අවිධිමත් කණ්ඩායම් ද, මෙම පෙර නොවූ විරූ දියුණුවෙන් නියම ප්‍රයෝජන ගනිමින්, ක්‍රියාකාරී ලෙස ක්ෂේත්‍රයේ කටයුතුවල නිරත වෙමින්, විශාල ලෙස ප්‍රතිලාභ ලබන බවද පෙනී යන කරුණකි. සංචාරක කර්මාන්තය ක්ෂේත්‍රයේ පසු පෙළ පාර්ශ්වවලට ද ප්‍රතිලාභ සලසන බවට මෙය හොඳ නිදර්ශනයකි.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පූර්ණ ආශිර්වාදය, ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මහතාගේ නායකත්වය හා ආර්ථික සංවර්ධන හා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මහතාගේ මගපෙන්වීම මත සංචාරක ප්‍රවර්ධන කටයුතු පවත්වාගෙන යන්නෙමු.

2012 වසර මැද භාගයේ දී, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සභාපතිවරයා ලෙස භාෂ්වර සේනාංක ගුණරත්න මහතා පත්වීමෙන් පසු ආයතනයේ සැලකිය යුතු ගාමක වෙනසක් දක්නට ලැබුණි. ඔහු යටතේ අලෙවි සැලසුම් හා ප්‍රවර්ධන කටයුතුවල පුනර්ජීවයක් උදාවිය. බොහෝමයක් ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සැලසුම් කරනු ලැබුවේ 2012 වසරේ අගභාගයේ දී හා 2013 වසරේ දීය.

ජාත්‍යන්තර මාධ්‍යවේදීන් කැඳවා ගැනීමේ වැඩසටහන තුළින් සැලකිය යුතු ප්‍රසිද්ධියක් ඇතිකර ගැනීමට හැකිවිය. 2011 දී ප්‍රචාරය සඳහා ලබාගත් මාධ්‍ය වටිනාකම රුපියල් මිලියන 500.9 ක් විය. (ඩොලර් මිලියන 3.8) 2012 වසරේ දී එය රුපියල් මිලියන 676 කි දක්වා වැඩි කෙරුණි. (ඩොලර් මිලියන 5.1) එහිදී තව තවත් මාධ්‍යවේදීන් මෙරට සංචාරය සඳහා ගෙන්වා ගනිමින්, ශ්‍රී ලංකාව කදිම සංචාරක ගමනාන්තයක් බවට පුළුල් ප්‍රචාරයක් ගෙනයාමට අපට හැකි විය.

මෙහිදී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට ලැබුණු හොඳම පිළිගැනීමක් ලෙස සැලකිය හැක්කේ ශ්‍රී ලංකාව 2013 වසරේ පොදුරාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායකයින්ගේ සමුළුවේ සත්කාරක රට ලෙස නිවේදනය කරනු ලැබීමයි. එමෙන්ම 2012 අයි.සී.සී. විස්සයි 20 ලෝක ක්‍රිකට් කුසලාන තරගාවලියේ සත්කාරක රට ලෙස ශ්‍රී ලංකාව නම්කරනු ලැබීම යන කරුණු නිසා ලොව ප්‍රමුඛ පෙළේ ප්‍රකාශන ආයතන හා ශ්‍රේණි ගත කිරීමේ ආයතන ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය මෙන්ම ශ්‍රී ලංකා සන්නාමය අන්තර්ජාතික වශයෙන් ඉහළට නංවන ලදී.

මේ සියලු කරුණු අනුව 2012 වසර සංචාරක කර්මාන්තය සඳහා ඉතා සාර්ථක කාලසීමාවක් විය. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ, ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ, විදේශ කටයුතු අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සභාපති භාෂ්වර සේනාංක ගුණරත්න, ශ්‍රී ලංකා මහකොමසාරිස්වරුන් හා තානාපතිවරුන්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය, ශ්‍රී ලන්කන් ගුවන් සේවය, මිහින් ලංකා ගුවන් සේවය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, මධ්‍යම සංස්කෘතික අරමුදල, ශ්‍රී ලංකාවට සංචාරකයින් මෙහෙයවන්නන්ගේ සංගමය, ශ්‍රී ලංකා හෝටල්කරුවන්ගේ සංගමය හා සංචාරක ක්ෂේත්‍රයේ සුළු හා මධ්‍ය පරිමාණ ආයතන හිමිකරුවන්ගේ සංගමය ආදී වූ සියලු පුද්ගලයින්ට හා ආයතනවලට මාගේ ස්තූතිය පුද කර සිටිමි.

2012 වසර ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සඳහා ඉතා සාර්ථක කාල සීමාවක් බව යළිත් වගකීමකින් යුතුව ප්‍රකාශ කරමි.



රූමි ජව්ෆර්



# සංඛ්‍යාන විග්‍රහය

## ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

2012 වසරේ අපේක්ෂිත ඉලක්කය වූ සංචාරකයින් 925,000 අභිබවා යමින් එම වසරේ ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 1,005,605 කි. එය 2011 වසර හා සසඳන විට 17.5% ක වර්ධනයකි.

**2012 මාසික සංචාරක පැමිණීම**

| මාසය | 2011 | 2012 | වර්ධන ප්‍රතිශතය% |
|---|---|---|---|
| ජනවාරි | 74,197 | 85,874 | 15.7 |
| පෙබරවාරි | 65,797 | 83,549 | 27.0 |
| මාර්තු | 75,130 | 91,102 | 21.3 |
| අප්‍රේල් | 63,835 | 69,591 | 9.0 |
| මැයි | 48,943 | 57,506 | 17.5 |
| ජූනි | 53,636 | 65,245 | 21.6 |
| ජූලි | 83,786 | 90,338 | 7.8 |
| අගෝස්තු | 72,463 | 79,456 | 9.7 |
| සැප්තැම්බර් | 60,219 | 71,111 | 18.1 |
| ඔක්තෝබර් | 69,563 | 80,379 | 15.5 |
| නොවැම්බර් | 90,889 | 109,202 | 20.1 |
| දෙසැම්බර් | 97,517 | 122,252 | 25.4 |






## 2012 දෙසැම්බර් 31 දිනට සංචාරකයින් වැඩියෙන්ම පැමිණි රටවල් 15

| අංකය | රට | ජන-දෙසැ 2011 | ජන-දෙසැ 2012 | වර්ධනය % |
|---|---|---|---|---|
| 1 | ඉන්දියාව | 171,374 | 176,340 | 2.9 |
| 2 | එක්සත් රාජධානිය | 106,082 | 114,218 | 7.7 |
| 3 | ජර්මනිය | 55,882 | 71,642 | 28.2 |
| 4 | ප්‍රංශය | 48,695 | 56,863 | 16.8 |
| 5 | මැදපෙරදිග | 56,330 | 56,169 | -0.3 |
| 6 | ඕස්ට්‍රේලියාව | 41,728 | 51,614 | 23.7 |
| 7 | මාලදිවයින | 44,018 | 47,572 | 8.1 |
| 8 | කැනඩාව | 24,671 | 29,329 | 18.9 |
| 9 | ඇමෙරිකාව | 24,386 | 29,907 | 22.6 |
| 10 | නෙදර්ලන්තය | 23,966 | 26,754 | 11.6 |
| 11 | ජපානය | 20,586 | 26,085 | 26.7 |
| 12 | රුසියාව | 21,385 | 28,402 | 32.8 |
| 13 | චීනය | 16,308 | 25,781 | 58.1 |
| 14 | මැලේසියාව | 16,094 | 21,776 | 35.3 |
| 15 | ස්විට්සර්ලන්තය | 14,110 | 20,054 | 42.1 |



# TRIP ව්‍යාපෘතිය - ජපානය

ශ්‍රී ලංකා රජයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ (JICA) සහාය ඇතිව සංචාරක සම්පත් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් (TRIP) ආරම්භ කළේය. මෙහි සමස්ත අරමුණ නම් විදේශීය සංචාරකයන් විශේෂයෙන් ජපාන සංචාරකයන් මෙහි ආකර්ෂණය කර ගනිමින් ජනතාවට විදේශ විනිමය උපයා ගැනීමට හා සංචාරක ක්ෂේත්‍රයේ ආදායම් අවස්ථා උදා කරමින් ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම හා දිළිඳුකම පිටුදැකීමයි. TRIP ව්‍යාපෘතිය යටතේ ජපාන වෙළඳපොළ කෙරෙහි අවධානය යොමු කරමින් සංචාරක හා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාවට නංවන ලදී. මෙම වැඩසටහන මගින් ජපාන සංචාරකයින් ආකර්ෂණය කරගැනීම සඳහා අලෙවි සහ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් ජපානය තුළ සිදු කෙරේ.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය අලෙවි වැඩසටහන් ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනයක් වන අතර, එහි ගමනාන්ත අලෙවි ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවන ලද්දේ නිහෝන් කේසායි වෙළඳ ප්‍රචාරණ සමාගම මගිනි. සමස්ත අලෙවි ප්‍රවර්ධන වැඩසටහන ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් නිරීක්ෂණය කරන ලදී. එම වැඩසටහන යටතේ පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය කරන ලදී.

1. අන්තර්ජාල වෙළඳ ප්‍රචාරණය
2. පාරිභෝගික ඉලක්ක ප්‍රචාරණ වැඩසටහන්
3. අවස්ථා ප්‍රවර්ධනය (FAM Trips)
4. මාධ්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම්
5. සංචාරක නියෝජිතයන් සඳහා ප්‍රවර්ධන කටයුතු
6. යෝජනා පාදක අලෙවි හා ප්‍රවර්ධන ක්‍රියාකාරකම් (දැනුවත්භාවය ඇති කිරීම)





# අලෙවි සහ ප්‍රවර්ධනය

## වෙළඳ සහ සංචාරක ප්‍රදර්ශන

| රට | වැඩසටහන්/ප්‍රවර්ධන | දිනය |
|---|---|---|
| | **ජනවාරි** | |
| නෙදර්ලන්තය | Vakantiebeurs වෙළඳ ප්‍රදර්ශනය | 10 - 15 ජනවාරි |
| ඔස්ට්‍රියා | Ferien වෙළඳ ප්‍රදර්ශනය | 12 – 15 ජනවාරි |
| ජර්මනිය | CMT - ස්ටුට්ගාට් | 14 – 22 ජනවාරි |
| | යාපනය ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනය | 20 – 22 ජනවාරි |
| එක්සත් රාජධානිය | මැන්චෙස්ටර් හොලිඩේ ඇන්ඩ් ට්‍රැවල් ෂෝ 2012 | 20 – 22 ජනවාරි |
| | චීන සංස්කෘතිකාංග, ශ්‍රී ලංකා සාම්ප්‍රදායික නැටුම් හා සංගීත අංග, ආහාර ප්‍රදර්ශනය | 28 ජනවාරි |
| | චීනයෙන් වෙනත් රටවල් කරා සිදු කෙරෙන සංචාර පිළිබඳ සම්මන්ත්‍රණය, සහය UNWTO | 30 මාර්තු |
| | **පෙබරවාරි** | |
| බෙල්ජියම | ව්‍යාපාරික නිවාඩු ප්‍රදර්ශනය | 02 - 06 පෙබරවාරි |
| චෙක් ජනරජය | හොලිඩේ වර්ල්ඩ් ට්‍රැවල් ෆෙයා - ප්‍රාග් | 09 -12 පෙබරවාරි |
| ඉතාලිය | BIT සංචාරක ප්‍රදර්ශනය - මිලාන්, | 16 -19 පෙබරවාරි |
| ඉන්දියාව | OTM සංචාරක ප්‍රදර්ශනය - මුම්බායි | 17 -19 පෙබරවාරි |
| ඉන්දියාව | OTM සංචාරක ප්‍රදර්ශනය - දිල්ලි | 23 - 24 පෙබරවාරි |
| ප්‍රංශය | Salon Nature (පාරිභෝගික සල්පිල) | 26 පෙබ. - 3 මාර්තු |
| ජපානය | ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වෙබ් අඩවිය ජපන් භාෂාවෙන් වැඩි දියුණු කිරීම | පෙබරවාරි |
| | **මාර්තු** | |
| ඇමරිකා එක්සත් ජනපදය | New York Times සංචාරක දැක්ම | 02 – 04 මාර්තු |
| ජර්මනිය | ITB සංචාරක ප්‍රදර්ශනය, බර්ලින් | 07 – 11 මාර්තු |
| රුසියාව | MITT සංචාරක ප්‍රදර්ශනය, මොස්කව් | 16 – 19 මාර්තු |
| චීනය | ගුවන්ෂු ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනය | 07 – 09 මාර්තු |
| චීනය | මාර්ග දැක්ම - ෂෙන්ෂෙන් සහ ගුවන්ෂු | 6 මාර්තු - 10 මාර්තු පිළිවෙලින් |
| ස්වීඩනය | TUR සංචාරක ප්‍රදර්ශනය | 22 – 25 මාර්තු |
| යුක්රේනය | UTTT සංචාරක ප්‍රදර්ශනය | 28 – 30 මාර්තු |
| ජපානය | සංචාරක නියෝජිත සමුළුව - ටෝකියෝ | 09 මාර්තු |
| ජපානය | සංචාරක නියෝජිත සමුළුව - ඔසාකා | 26 මාර්තු |
| ජපානය | සංචාරක නියෝජිත සමුළුව - නගෝයා | 27 මාර්තු |
| | **Expo 2012 – Tourism Forum** | |
| | නියෝජිතයින් දැනුවත් කිරීමේ චාරිකා<br>කොරියා/ජෝර්දාන්/ඕමාන්/චීනය/සිංගප්පූරුව/සවුදි අරාබිය/ඉතාලිය<br>දෝහා කටාර්/ඉන්දියා/ඉන්දුනීසියා/ඇමෙරිකා එ.ජ./මැලේසියාව | 28 මාර්තු - 1 අප්‍රේල් |

| | | |
|---|---|---|
| **අප්‍රේල්** | | |
| කසක්ස්ථානය<br>ජපානය<br>ජපානය | KITF වෙළඳ ප්‍රදර්ශනය<br>සමුද්‍ර කිමිදුම් සංචාරක ප්‍රදර්ශනය<br>චාරිකා නියෝජිත වැඩමුළුව, කෝබේ | 25 – 27 අප්‍රේල්<br>06 – 08 අප්‍රේල්<br>27 අප්‍රේල් |
| **මැයි** | | |
| සවුදි අරාබිය<br>එක්සත් රාජධානිය<br>ජපානය<br>වෙබ් අඩවිය | අරාබි සංචාරක පොළ (ATM)<br>චෙල්සි මල් දැක්ම<br>JATA කලාපීය කමිටු සාමාජික සංචාරය<br>ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය බීබීසී නාලිකාවේ (දේශීය පිටුවේ සහ සංචාරක අංශයේ) හා Lonely planet වෙබ් අඩවියේ වෙසක් උත්සවය වෙනුවෙන් ඩිජිටල් ප්‍රචාරක වැඩසටහනක් දියත් කළේය. මෙය විශේෂයෙන් දකුණු ආසියානු, (ඉන්දියාව හා බංගලාදේශය) අග්නිදිග ආසියානු, (තායිලන්තය, ඉන්දුනීසියාව සහ වියට්නාමය) චීන දකුණු, කොරියානු හා ජපානය වැනි රටවල බෞද්ධ ජනතාව ඉලක්කකොට ක්‍රියාත්මක කෙරුණි. | 30 අප්‍රේල් – 03 මැයි<br>මැයි<br>13 – 19 මැයි<br>මැයි |
| **ජුනි** | | |
| කොරියාව<br>චීනය<br>චීනය | KOFTA ලෝක සංචාරක දැක්ම<br>BITE සංචාරක ප්‍රදර්ශනය - බීජිං<br>මාර්ග දැක්ම, ටියැන්ජින් සහ බීජිං | 7 – 10 ජුනි<br>15 – 17 ජුනි<br>14 ජුනි - 16 ජුනි පිළිවෙලින් |
| **ජූලි** | | |
| ජපානය<br>ජපානය<br>ජපානය<br>ජපානය | සංචාරක නියෝජිතයින් දැනුවත් කිරීමේ චාරිකා<br>සංචාරක නියෝජිතයින් දැනුවත් කිරීමේ චාරිකා<br>Asahi පුවත් පතේ වෙළඳ දැන්වීම්<br>Nikkei පුවත් පතේ වෙළඳ දැන්වීම් | 12 - 16 ජූලි<br>31 ජූලි – 04 අගෝස්තු<br>04 ජූලි<br>11 ජූලි |
| **අගෝස්තු** | | |
| | ඉන්දියානු ක්‍රීඩකයින් සියයක් පමණ සහභාගි වූ ප්‍රෝ ගොල්ෆ් තරගාවලිය | |
| **සැප්තැම්බර්** | | |
| ජපානය<br>ජපානය<br>ස්වීඩනය<br>රුසියාව<br>ජපානය<br>ප්‍රංශය<br>පෝලන්තය | ශ්‍රී ලංකා සංදර්ශනය<br>කාන්තාවන්ට පමණයි, විශේෂිත කාර් රථවල වෙළඳ ප්‍රචාරණය<br>ස්ටොක්හෝම් සිනමා උළෙලේ වෙළඳ ප්‍රචාරණය<br>විවේකී චාරිකා සහ සංචරණ ප්‍රදර්ශන<br>JATA සංචාරක ප්‍රදර්ශනය - ටෝකියෝ<br>IFTM සංචාරක ප්‍රදර්ශනය<br>TT Warsaw සංචාරක ප්‍රදර්ශනය<br>අයි.සී.සී. විස්සයි 20 ක්‍රිකට් ශූරතා තරගාවලිය - ශ්‍රී ලංකා සංචරණය ප්‍රවර්ධනය කිරීමේ තත්පර 30 වීඩියෝ කොටස් තරගාවලිය නිල විකාශන නාලිකාව තුළින් ප්‍රචාරය කෙරුණි. තත්පර 15 වෙළඳ දැන්වීම් පුණරූපන තිරයේ විකාශය කෙරුණි. | 08 – 09 සැප්තැම්බර්<br>11 සැප්. – 10 ඔක්.<br>17 – 24 සැප්.<br>19 – 22 සැප්.<br>20 – 23 සැප්.<br>18 – 21 සැප්.<br>27 – 29 සැප්.<br>18 සැප්. – 07 ඔක්. |
| **ඔක්තෝබර්** | | |
| සිංගප්පූරුව<br>යුක්‍රේනය | ITB ආසියාව<br>UTM සංචාරක ප්‍රදර්ශනය | 03 – 05 ඔක්තෝබර්<br>11 – 13 ඔක්තෝබර් |
| **නොවැම්බර්** | | |
| එක්සත් රාජධානිය<br>ජපානය<br>චීනය<br>චීනය<br>ජපානය<br>චීනය | ලෝක සංචාරක වෙළඳපොළ (WTM)<br>සංචාරක නියෝජිතයින් දැනුවත් කිරීමේ චාරිකා<br>ජාත්‍යන්තර චීන, සංචාරක පොළ, ශැන්ග්හයි<br>මාර්ග දැක්ම, හැන්ග්ජු<br>සංචාරක නියෝජිත වැඩමුළුව<br>ජාත්‍යන්තර වැංග්ඩු සංචාරක වෙළඳපොළ | 05 – 08 නොවැම්බර්<br>22 – 29 නොවැම්බර්<br>22 – 24 නොවැම්බර්<br>25 නොවැම්බර්<br>06 නොවැම්බර්<br>29 නොවැ. – 1 දෙසැ. |

# එක්සත් රාජධානිය

### ලෝක සංචාරක වෙළඳ පොළ - එක්සෙල් ප්‍රදර්ශන ශාලාව, ලන්ඩන් - 2012 නොවැම්බර් 5-8

5000ක පමණ වෙළඳ පාර්ශ්වකරුවන්(ප්‍රදර්ශකයින්) ආකර්ෂණය වුණු මෙම ලන්ඩන් වෙළඳ ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයද සහභාගි විය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශ වෙළඳ කුටියේදී සියලු චාරිත්‍ර හා සම්ප්‍රදායයන්ගෙන් යුත් චිරාගත විවාහ මංගල උත්සවයක් සිදුකෙරුණු අතර, එමගින් ශ්‍රී ලංකාවේ පොහොසත් සංස්කෘතික සම්ප්‍රදායයන් පිළිබඳව ද නරඹන්නන්ට දැකබලා ගැනීමට මහඟු අවස්ථාවක් උදා විය. ශ්‍රී ලංකාව හොඳම ක්‍රිකට් ගමනාන්තයක් ලෙස හුවා දැක්වීම පිණිස ප්‍රදර්ශනයේ තුන්වෙනි දිනයේදී අප වෙළඳ කුටියේ කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා ක්‍රිකට් නිල ටී ෂර්ට්වලින් සැරසී සිටියහ. එහි අරමුණ වූයේ ශ්‍රී ලංකාව ක්‍රිකට් ක්‍රීඩාවට ප්‍රසිද්ධ රටක් ලෙස ලෝක සංචාරක වෙළඳ පොළ තුළ ප්‍රචලිත කරමින් වැඩිවැඩියෙන් ක්‍රිකට් ලෝලීන් දිවයින කෙරෙහි ආකර්ෂණය කරවා ගැනීමයි.

### කෙන්ට්හි "සාගා මාර්ග දැක්ම" ඩෙන්බීස් මිදි වතු යාය - 2012 ජූලි 23

ඩෙන්බීස් මිදි වතු යායේ සාගා හොලිඩේස් ආයතනය සංවිධානය කළ "සාගා මාර්ග දැක්මෙන්" දිගු කාලීනව නිවාඩු බුක්ති විඳින්නන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරුණි. මෙම අවස්ථාවට සංචාරක නියෝජිතයෝ 200ක් පමණ සහභාගි වූහ. "සාගා හොලිඩේස්" යනු පසුගිය වසරවල ශ්‍රී ලංකාව නැරඹීම සඳහා වැඩි වශයෙන් එක්සත් රාජධානියේ සංචාරකයින් යොමු කළ ප්‍රධාන පෙළේ සංචාරක මෙහෙයුම් ආයතනවලින් එකකි. ආරාධිත පුද්ගලයින් අතර ශ්‍රී ලංකාව පුළුල් විවිධත්වයෙන් යුත් ගමනාන්තයක් ලෙස ප්‍රචලිත කිරීමට මෙම මාර්ග දැක්මෙන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට අවස්ථාව උදා වුණි. සංස්කෘතික කණ්ඩායමක් විසින් සම්ප්‍රදායික ශ්‍රී ලාංකික නැටුම් ඉදිරිපත් කරමින් මෙහි පැමිණි අමුත්තෝ ප්‍රමෝදයට පත් කරනු ලැබූහ.

### බර්මින්හැම් TTG මාර්ග දැක්ම - 2012 සැප්තැම්බර් 24

TTG මාර්ග දැක්මට ශ්‍රී ලංකා සංචරණය සහභාගි වෙමින් ප්‍රධාන අලෙවි පණිවුඩයක් එහි සංචාරක නියෝජිත පාර්ශ්වකරුවන් වෙත ලබාදීමටත් ඔවුන් සමග පුළුල් සබඳතා ඇති කරගැනීමටත් ක්‍රියා කළේය.

### වෙස්ට් ඔෆ් PATA ලන්ඩන් මාර්ග දැක්ම - 2012 සැප්තැම්බර් 11

ශාන්තිකර ආසියා සංචාරක සංගමයේ (PATA) එක්සත් රාජධානි පාර්ශ්වය සංවිධාන කළ මෙම මාර්ග දැක්මට එක්සත් රාජධානියේ PATA සාමාජිකයන් 15 දෙනෙකු සහභාගි වූ අතර, 300කට අධික සංචාරක නියෝජිතයින් හා චාරිකා මෙහෙයුම්කරුවෝ පිරිසක්ද එක්වූහ. ශ්‍රී ලංකාව විශ්වසනීය සංචාරක ගමනාන්තයක් ලෙස නව සංචාරක නියෝජිතයින් හා මෙහෙයුම්කරුවන්ට චිත්තු ගැන්වීමට මෙයින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට අවස්ථාව උදා විය.

### මැන්චෙස්ටර් හොලිඩේ ෂෝ 2012 - 2012 ජනවාරි 19-22 දක්වා මැන්චෙස්ටර්හිදී

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සංචාරක උපදේශකයන් හා එක්ව සහභාගි වූ මෙම නිවාඩු හා සංචාරක දැක්ම එක්සත් රාජධානියේ මුල් පෙළේ සංචරණ ප්‍රදර්ශනවලින් එකක් වූ අතර, එය මෙවර පවත්වනු ලැබුවේ 18 වන වසරටයි. එමෙන්ම මැන්චෙස්ටර් නගරයේ එය පැවැත්වූ පළමු වතාවද මෙය විය. මෙම අවස්ථාවට සංචරණ තොරතුරු හා විශේෂිත ගමනාන්ත පිළිබඳ උනන්දුව දක්වන සංචාරකයෝ 10,000කට අධික පිරිසක් සහභාගි වූහ.

### ගමනාන්ත සංචාරක දැක්ම, ලන්ඩන් - වෝවික් රෝඩ් අර්ල්ස් කෝට් පරිශ්‍රය - 2012 පෙබරවාරි 02-05

පාරිභෝගිකයින් වෙනුවෙන් මෙම ගමනාන්ත සංචාරක දැක්මට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහභාගි වූයේ පැරඩයිස් වැකේෂන්ස් ආයතනය හා ශ්‍රී ලංකන් ගුවන් සේවය සමග සහයෝගිතාවයෙනි. මෙම අවස්ථාවට සංචාරක ලෝලීන් හා ප්‍රමුඛ පෙළේ සංචාරක නියෝජිතයෝ 30,000කට අධික පිරිසක් සහභාගි වූහ. "පැරඩයිස් වැකේෂන්ස් ආයතනය" මෙහිදී ඇණවුම් 200 කට අධික සංඛ්‍යාවක් බාර ගත් අතර, ඉන් 74 ක් දැනටත් ක්‍රියාත්මක වේ.

### ලන්ඩන් විවාහ මංගල උත්සව ප්‍රදර්ශනය - වෝවික් රෝඩ් අර්ල්ස් කෝට් පරිශ්‍රය - 2012 පෙබරවාරි 02-05

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මෙම ප්‍රදර්ශනයට සහභාගි වෙමින් එහි ක්‍රියාශීලී අමුත්තන් සමග අදහස් හුවමාරු කරගැනීමට කදිම වේදිකාවක් තනා ගත්තේය. එක්සත් රාජධානියේ විවාහ මංගල උත්සව හා මධුසමය වෙළඳ පොළ ඉතාම ලාබදායී හා අධික තරගකාරිත්වයෙන් යුක්තය. එරට විවාහ මංගල උත්සවයක් සඳහා පවුම් 20,000ක් පමණ වැය වේ. එරට බොහෝමයක් විවාහ මංගල උත්සව රටින් බැහැරදී සංවිධානය කෙරෙන බැවින් ශ්‍රී ලංකාව විවාහ මංගල උත්සව ගැනීමේ හා මධුසමය ගත කිරීමේ ඉතාම ආකර්ෂණීය ගමනාන්තයක් ලෙස ප්‍රචලිත වෙමින් පවතී. දින 03 ක් පුරා පැවති ලන්ඩන් විවාහ මංගල උත්සව ප්‍රදර්ශනය නැරඹීමට දසදහසකට අධික පිරිසක් ලන්ඩන් ඔලිම්පියා වෙත පැමිණියහ. බෙයාර් ෆුට් සංචාරක නියෝජිත ආයතනය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය එක්ව මෙම විවාහ මංගල උත්සව දැක්ම සංවිධානය කළ අතර, බෙයාර් ෆුට් ආයතනය වෙත ශ්‍රී ලංකාවේ මධුසමය ගත කිරීම පිළිබඳ විමසීම් 65ක්ද විවාහ මංගල උත්සව විමසීම් 03ක්ද ලැබුණි.

### චෙල්සි මල් දැක්ම - චෙල්සි ලන්ඩන් - 2012 මැයි 21-25

විශාල වටකුරු ප්‍රදර්ශන භූමිය මැද හරිත පෙළ පාසිවලින් වැසීගත් කඳු ගැටයක නිර්මාණය කොට තිබුණේ සීගිරියේ සිංහ පාදයේ අනුරුවක්ද සහිතවය. එය පාමුල සුන්දර සුදු පැලියනොප්සිස් ඕකිඩ්මලින් සරසා තිබුණි. එහි නිර්මිත තාරකා එළියේ දිදුලන ගුහාවක් තුළින් ගලා යන දියදහරාවක් සිහින් දිය ඇල්ලක් ලෙස නිශ්චල පොකුණකට කඩා හැලෙමින් තිබුණි. පොකුණ තුළ පාවෙන දූපත් කීපයකි. එහි තිබූ දියමන්ති ජුබිලි ඕකිඩ් අති ගෞරවණීය බ්‍රිතාන්‍ය මහරැජින වෙත ප්‍රදානය කරන ලදී.














# චීනය

**බෙයිජිං ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනය** (BITE) **චීන ජාතික සම්මේලන මධ්‍යස්ථානය - 2012 ජුනි 15-17**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයද සහභාගි වූ මෙම ප්‍රදර්ශනයට රටවල් 40න් හා චීනයේ පළාත් 30න් ප්‍රදර්ශකයෝ 800ක් පමණ සහභාගි වූහ.

**චීන ජාත්‍යන්තර සංචාරක වෙළඳ පොළ** (CITM) **2012 - ෂැංහයි නව ජාත්‍යන්තර ප්‍රදර්ශන මධ්‍යස්ථානය - 2012 නොවැම්බර් 15-18**

චීනයේ වෙළඳ ගැනුම්කරුවන් 1000ක් හා මාධ්‍යකරුවන් 800ක් ඇතුළුව රටවල් 80න් පාර්ශ්වකරුවන් සහභාගි වූ මෙම සල්පිලට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයද එක් විය.

Hangzhou **මාර්ග දැක්ම - නියාන් යුවාන් කුළුණ - 2012 නොවැම්බර් 19**

සංචාරක නියෝජිතයන් 45 දෙනෙකු පමණ සහභාගි වූ මෙම මාර්ග දැක්මට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයද එක්විය. එහිදී සංචාරක නියෝජිතයන් මුහුණට මුහුණ ව්‍යාපාර හමුවීම්වල නිරත වූ අතර ශ්‍රී ලංකාව පිළිබඳව චීන සංචාරක නියෝජිතයෝ ප්‍රචාරණ ආදර්ශයන් ඉදිරිපත් කළහ.

**බෙයිජිං හා ටියැංජින් මාර්ග දැක්ම - 2012 ජුනි 14-18**

මෙම අවස්ථාවලට සංචාරක නියෝජිතයින් 40 ක් 50 ක් පමණද මාධ්‍යවේදීහු 10ක් 15 ක් පමණද නගර දෙකේදීම සහභාගි වූහ. මෙහිදී සංචාරක නියෝජිතයින් මුහුණට මුහුණ සාකච්ඡා පැවැත්වූ අතර, ඇතැම් නියෝජිතයෝ සිය ප්‍රචාරණ ආදර්ශද ඉදිරිපත් කළහ.

**ගුවන්ෂු ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය 2012 - චීන ආනයන හා අපනයන සංකීර්ණය - ගුවන්ෂු - 2012 මාර්තු 01-03**

මෙම අවස්ථාවට රටවල් 40න් හා චීනයේ පළාත් 30න් ප්‍රදර්ශකයෝ 800ක් පමණ පිරිසක් සහභාගි වූහ. මෙහි ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශ වෙළඳ කුටියට අමුත්තන් වැඩිම පිරිසක් පැමිණි අතර, හොඳම වෙළඳ කුටියට හිමි සම්මානයද පිරිනැමුණි. එහිදී සංචාරක නියෝජිතයෝ එකිනෙකා හමු වී ව්‍යාපාර ප්‍රවර්ධන සාකච්ඡාවල නිරත වූහ. ශ්‍රී ලංකාව පිළිබඳ චීන නියෝජිතයෝ ප්‍රචාරණ ඉදිරිපත් කිරීම් ද සිදුකළහ.















ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

## රුසියාව

**මොස්කව් ජාත්‍යන්තර චාරිකා හා සංචාරක සල්පිල 2012 - එක්ස්පෝ මධ්‍යස්ථානය මොස්කව් රුසියාව - 2012 මාර්තු 21 - 24**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහභාගි වූ මෙම සල්පිලට රටවල් 197 කින් නියෝජිතයෝ පැමිණියහ. ශ්‍රී ලංකා වෙළඳ කුටියේදී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශ වෙළඳ ලකුණ කැපී පෙනෙන ලෙස විදහා දක්වන ලදී.

Otdykh **විවේක චාරිකා හා සංචාරක ප්‍රදර්ශනය 2012**-IEC Croscus **එක්ස්පෝ මොස්කව්, රුසියාව - 2012 සැප්තැම්බර් 19-22**

අදාළ ක්ෂේත්‍රයේ විවිධ නියෝජිත ආයතන, සම්පත් දායකයින්, හෝටල්, සංස්ථා හා ප්‍රදර්ශකයෝ රැසක් මෙයට සහභාගි වූහ.







## යුක්රේනය

**යුක්රේන ජාත්‍යන්තර චාරිකා හා සංචාරක වෙළඳ පොළ - කීව් 2012 මාර්තු 28-30**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ඇතුළුව රටවල් 50 කින් නියෝජිතයෝ මෙයට එක් වූහ. ශ්‍රී ලංකා සංචරණ නාමාවලිය මෙහිදී රුසියානු භාෂාවෙන් හඳුන්වා දෙන ලදී.

**යුක්රේන ජාත්‍යන්තර ප්‍රදර්ශනය 2012 - කීව් ජාත්‍යන්තර ප්‍රදර්ශන මධ්‍යස්ථානය - 2012 ඔක්තෝබර් 11-13**

මෙහි ශ්‍රී ලංකා කුටියේදී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශ සලකුණ ප්‍රමුඛ ලෙස විදහා දක්වමින් එහි තේමා පාඨය වූ "නැවුම් වන දිවයින - ශ්‍රී ලංකාව" යන්න අවධාරණය කරන ලදී.






## කසක්ස්ථානය

**කසක්ස්ථාන ජාත්‍යන්තර චාරිකා හා සංචාරක ප්‍රදර්ශනය - ඇට්කෙන්ට් මධ්‍යස්ථානය අල්මාතී - 2012 අප්‍රේල් 25-27**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හා කසක්ස්ථාන සංචාරක නියෝජිතයින් 1252ක් ඇතුළුව රටවල් 40න් නියෝජිතයෝ මෙයට සහභාගි වූහ. මෙහිදී ක්‍රියාකාරී සහභාගිත්වය වෙනුවෙන් ශ්‍රී ලංකාවට "කෘතගුණ සැලකීමේ සහතිකය" පිරිනමන ලදී.



**ඇස්ටානා මාර්ග දැක්ම, ප්‍රසිඩන්ට් රික්සුස් හෝටලය - 2012 නොවැම්බර් 21**

අතිගරු ජනාධිපති තුමාගේ කසක්ස්ථාන සංචාරයට සමගාමීව සංවිධානය කෙරුණු මෙම අවස්ථාවට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයද හෝටල්කරුවන් හා චාරිකා මෙහෙයුම්කරුවෝ 200ක් පමණ සහභාගි වූහ.



## ජර්මනිය

**ජාත්‍යන්තර ටුවරිස්ට් මුස් බෝසේ** (ITB) **මෙස, බර්ලින් - 2012 මාර්තු 07-11**

ලොව ප්‍රමුඛ පෙළේ චාරිකා වෙළඳ දැක්මක් වූ මෙයට, ප්‍රදර්ශකයෝ 1,100ක් පමණ එක් වූහ. එහිදී රටවල් 188ක සමාගම් 11,163ක් සිය නවතම සංචාරක නිෂ්පාදන හා සේවා ප්‍රදර්ශනය කළහ. එහි දත්ත අනුව නරඹන්නන් 170,000 ක් පැමිණ ඇති බව හෙළි වී තිබේ. ඉන් 40% ක්ම විදේශීය වෙළඳ නියෝජිතයෝ වූහ. රටවල් 94කින් මාධ්‍යවේදීන් 7,000කටද ප්‍රවේශ වීම සඳහා හැඳුනුම් පත් නිකුත් කර ඇත. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ පාර්ශ්වකරුවන්, චාරිකා සංවිධායකයින්, හෝටල්කරුවන්ද ඇතුළුව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සම-ප්‍රදර්ශකයන් 60ක් සමග මෙම අවස්ථාවට සහභාගි වී තිබේ.

CMT 2012 - **ස්ටුට්ගාට් 2012 ජනවාරි 14 - 22**

මෙයට ශ්‍රී ලංකා වෙළඳ සමාගම් 04 ක් සහභාගි විය. ජර්මනියේ විශාලතම පාරිභෝගික වෙළඳ ප්‍රදර්ශනය ලෙස සැලකෙන මෙයට අමුත්තන් 223,000ක් පමණ ආකර්ෂණය වී ඇත. (වෙළඳ මාධ්‍ය හා මහජනතාව)




## ප්‍රංශය

**ජාත්‍යන්තර ප්‍රංශ චාරිකා වෙළඳ පොළ** (IFPM) Top Resa - Parc d'Exposition - Paris Porte de Versailles - **2012 සැප්තැම්බර් 18-21**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මෙම අවස්ථාවට සහභාගි වී එහි පැමිණි අමුත්තන්ට ශ්‍රී ලංකා තේවලින් සංග්‍රහ කළේය. වර්ග මීටර් 27,000ක් පමණ භූමි භාගයක පැතිර තිබූ මෙම ප්‍රදර්ශනයේ වෙළඳ කුටි 315කට අධික සංඛ්‍යාවක් පැවති අතර, වෙළඳ සන්නාම 1,250කට අධික සංඛ්‍යාවක් ප්‍රචාරණය කරන ලදී. සංචාරක කාර්යාල 164 කින් නියෝජිතයෝ මෙහි පැමිණ සිටියහ.

## ස්වීඩනය

TUR **චාරිකා හා සංචාරක ප්‍රදර්ශනය - 2012 මාර්තු 22-25 - ස්වෙන්ස්කා මැසන්, ගොතන්බර්ග්**

රටවල් 79 කින් නියෝජිතයින් පැමිණි මෙම ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ නියෝජිතයෝද එක්වූහ.




## ඉතාලිය

Borsa Internationale de Tourisme (BIT ) **වෙළඳ ප්‍රදර්ශනය, ජ්ලේරා, මිලානෝ - 2012 පෙබරවාරි 16-19**

මෙම ප්‍රදර්ශනයට සහභාගි වූ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය එහි පැමිණි අමුත්තන්ට ශ්‍රී ලංකා තේවලින් සංග්‍රහ කළේය. මෙහිදී වැදගත් සම්බන්ධතා රැසක් ඇති කර ගනු ලැබීය. RAI රූපවාහිනී නාලිකාව, "VIAGGIANDO" ටැවල් මැගසින්. ජියෝ රිපෝටර් සහ මාරි ක්ලෙයාර් ට්‍රැවල් වාර සඟරාව ආදිය එසේ සම්බන්ධතා ආරම්භ කළ අතර, ශ්‍රී ලංකාව නැරඹීම සඳහා පැමිණීමටත් ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තා චිත්‍රපට නිපදවීමටත් දැඩි උනන්දුවක් පළ කළේය.

## නෙදර්ලන්තය

**Vakantiebeurs වෙළඳ ප්‍රදර්ශනය - රාජකීය ඕලන්ද ජාබියස් ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානය, උට්රෙච්ට් - 2012 ජනවාරි 10-15**

නෙදර්ලන්තයේ ප්‍රධාන පෙළේ සංචාරක වෙළඳ ප්‍රදර්ශනයක් වන මෙයට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මෙන්ම රටවල් 108කින් නියෝජිත ආයතන සහභාගි විය.




## එක්සත් අරාබි එමීර් රාජ්‍යය

**ATM ඩුබායි වෙළඳ ප්‍රදර්ශනය - ඩුබායි ජාත්‍යන්තර ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානය - 2012 අප්‍රේල් 30 - මැයි 03**

රටවල් 50 කින් ප්‍රදර්ශකයෝ මෙයට එක් වූහ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මාධ්‍ය සාකච්ඡා, රූපවාහිනී සම්මුඛ සාකච්ඡා, පුවත් පත් ලිපි පළ කිරීම ආදිය මගින් පුළුල් ප්‍රචාරයක් ලබා ගනිමින් ප්‍රවර්ධන කටයුතු සිදු කළේය.




## ඉන්දියාව

**OTM මුම්බායි හා නවදිල්ලිය - 2012 - මුම්බායි ප්‍රදර්ශන මධ්‍යස්ථානය - 2012 පෙබරවාරි 17-19**

**ප්‍රගති, මයිදාන් - නවදිල්ලිය - 2012 පෙබරවාරි 24-26**

මෙයට රටවල් 61 කින් හා ඉන්දියාවේ ප්‍රාන්ත හා පළාත් 35 කින් ප්‍රදර්ශකයෝ 1,500ක් පමණ සහභාගි වූහ. විදේශ රටවලින් මෙයට ඉතා පුළුල් සහභාගිත්වයක් ලැබුණි. 186,000 කට වැඩි පිරිසක් එය නරඹා තිබුණි. මෙම වෙළඳ ප්‍රදර්ශනයේදී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හොඳම සැරසිලි සහිත කුටියට හිමි ස්ථානය දිනා ගත්තේය.

**නවදිල්ලිය - නිදහස් දින සැමරුම් උත්සවය, ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය නවදිල්ලිය - 2012 පෙබරවාරි 04**

නවදිල්ලි - ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේදී ශ්‍රී ලංකා සූපවේදීන් දෙදෙනෙකුගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා ආහාර ප්‍රදර්ශනයක් පැවැත්වුණි.




## බෙල්ජියම

**Salon De Vacances (බ්‍රසල්ස් හොලිඩේ ෆෙයාර්) - බ්‍රසල්ස් එක්ස්පෝ - 2012 පෙබරවාරි 06-10**

රටවල් 145 කින් පමණ නියෝජිතයින් සහභාගි වූ මෙම උත්සවයෙහි නිවාඩු, චාරිකා හා සංචාරක විනෝද කටයුතු සල්පිලක් ඇතුළුව අංග රැසක් පැවැත්වුණි. චාරිකා හා ගමන් ක්ෂේත්‍රයේ නියෝජිතයින්ට සිය ව්‍යාපාර කටයුතු ප්‍රවර්ධනය කර ගැනීමට මහඟු අවස්ථාවක් මෙහිදී උදා විය. ඔවුන්ට සිය නිෂ්පාදන සේවා හා ගමනාන්ත පිළිබඳ පුළුල් ප්‍රචාරණයක් සිදුකිරීමට මෙහි ඉඩ ප්‍රස්ථාව සලසා තිබුණි. වෘත්තීමය සංචාරකයන්ට හා චාරිකා නියෝජිතයන්ට එකිනෙකා හමු වීම සඳහා මෙය කදිම තෝතැන්නක් විය.

## පෝලන්තය

**TT වෝසෝ ජාත්‍යන්තර චාරිකා ප්‍රදර්ශනය - වෝසෝ වෙළඳ ප්‍රදර්ශන සමුළු මධ්‍යස්ථානය - 2012 අගෝස්තු 07 - සැප්තැම්බර් 09**

පෝලන්තයේ මෙම වෙළඳ ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහභාගී වීමෙන් එරට හා ජාත්‍යන්තර පාර්ශවකරුවන් සමග පුළුල් සබඳතා ගොඩනගා ගැනීමට හැකියාව ලැබුණි. රටවල් සීයකින් පමණ නියෝජිතයෝ මීට එක් වූහ.

## චෙක් ජනරජය

**නිවාඩු ලෝක වෙළඳ ප්‍රදර්ශනය - ප්‍රාග් ප්‍රදර්ශන භූමිය - 2012 පෙබරවාරි 09-12**

රටවල් 47 කින් නියෝජිතයන් සහභාගි වූ මෙයට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයද එක් වී සංචාරක ප්‍රවර්ධන අවස්ථා රැසක් උදාකර ගෙන ඇත. එම විශිෂ්ට සංචාරක අත්දැකීම් සමග ප්‍රදර්ශනය ඉතා පුළුල් පරාසයක වෙළඳ අවස්ථා හා ඉඩහසර පාර්ශ්වකරුවන්ට ලබාදුනි. එමෙන්ම අමුත්තන්ට හා ප්‍රදර්ශකයන්ටද සතුට හා විනෝදය සැපයූ අවස්ථාවක් ලෙසද මෙය සැලකිය හැකිය.

## බංගලාදේශය

**බංගලාදේශ ජාත්‍යන්තර සංචාරක සල්පිල - බංගබන්දු ජාත්‍යන්තර සම්මේලන මධ්‍යස්ථානය - ඩකා - 2012 සැප්තැම්බර් 27-29**

මෙම උත්සවයට ශ්‍රී ලංකා සංචරණය වෙනුවෙන් බංග්ලාදේශයේ ශ්‍රී ලංකා මහකොමසාරිස්වරයා සහභාගි විය. රටවල් 15 ක නියෝජිතයෝද මෙම අවස්ථාවට එක් වූහ.

**ආසියානු සංචාරක ප්‍රදර්ශනය (ATF) - බංගබන්දු ජාත්‍යන්තර සම්මේලන මධ්‍යස්ථානය - ඩකා - 2012 සැප්තැම්බර් 21-23**

මෙහිදී ශ්‍රී ලංකා නැටුම් කණ්ඩායමක් රැඟුම් ඉදිරිපත් කළ අතර, රටවල් 15 ක නියෝජිත සහභාගිත්වයක් වාර්තා විය. ශ්‍රී ලංකා සංචරණය වෙනුවෙන් බංග්ලාදේශයේ ශ්‍රී ලංකා මහකොමසාරිස්වරයා මෙම උත්සවය නියෝජනය කළේය.

## කොරියාව

**25 වැනි කොරියා ලෝක චාරිකා සල්පිල (KOTFA) - සම්මේලන හා ප්‍රදර්ශන මධ්‍යස්ථානය - සෝල් කොරියාව - 2012 ජූනි 07-10**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මීට එක් වී කොරියානු සමාගම් 20 ක් සමග මුහුණට මුහුණ වෙළඳ සාකච්ඡා සිදුකළේය. රටවල් 60 කින් පාර්ශ්වකරුවෝ මීට එක් වූහ.

**15 වැනි බූසාන් ජාත්‍යන්තර චාරිකා ප්‍රදර්ශනය 2012 - බෙක්සකෝ ප්‍රදර්ශන මධ්‍යස්ථානය - බූසාන්**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හා රටවල් 37කින් නියෝජිතයෝ මීට සහභාගි වූහ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මෙහිදී කොරියානු සමාගම් 20 ක් සමග මුහුණට මුහුණ වෙළඳ සාකච්ඡාවල නිරත විය.

# සිංගප්පූරුව

### ITB ඒෂියා 2012 - සෑන්ඩ් එක්ස්පෝ සහ සම්මේලන මධ්‍යස්ථානය - මැරිනාබේ සෑන්ඩ්ස් - සිංගප්පූරුව - 2012 ඔක්තෝබර් 17-19

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මීට එක් වෙමින් සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රධාන පෙළේ පාර්ශ්වකරුවන් සමග සමීප වෙළඳ සබඳතා ගොඩ නගා ගෙන තිබේ. එමෙන්ම කලාපයේ ප්‍රචලිත චාරිකා සැලසුම්කරුවන් සමග ව්‍යාපාර අවස්ථා ඇති කර ගැනීමට මෙය හොඳ අවස්ථාවක් විය. රටවල් 50 ක නියෝජිතයෝ මෙයට පැමිණියහ.







# ඕස්ට්‍රේලියාව

### සිඩ්නි සංස්කෘතික දැක්ම - 2012 ඔක්තෝබර් 13

සිඩ්නිහි ඩාර්ලින් වරාය ප්‍රදේශයේ පැවැති සංචාරක ප්‍රවර්ධන ක්‍රියාන්විතයකි. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික නැටුම් (විවිධ සම්ප්‍රදායේ නැටුම් අංග 26ක්) හා ශ්‍රී ලංකා ආහාර දැක්මක්ද මෙහිදී ඉදිරිපත් කෙරුණි.

ඩාර්ලින් වරාය පාලම අසල පැවැත් වූ මාර්ග සංදර්ශනයේදී ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේද සහභාගිත්වයෙන් සංස්කෘතික අංග ඉදිරිපත් කෙරුණි. මෙම උත්සවයේ අරමුණ වූයේ,

- ශ්‍රී ලංකාවේ පවතින යහපත් ආර්ථික හා දේශපාලනික වාතාවරණය පිළිබඳව
- ඕස්ට්‍රේලියානු පුරවැසියන් තුළ පුළුල් අවබෝධයක් ඇති කිරීම.
- ශ්‍රී ලංකාවේ ආකර්ෂණීය ස්ථාන පිළිබඳ ප්‍රචාරණයක් ලබා දීම.







### ක්‍රිකට් ප්‍රචාරණය 2012 දෙසැම්බර් 26

මෙල්බර්න් ක්‍රිකට් ක්‍රීඩාංගණයේ හා සිඩ්නි ක්‍රිකට් ක්‍රීඩාංගණයේ ප්‍රචාරණ වැඩසටහන් ශ්‍රී ලංකා ක්‍රිකට් පිළේ ඕස්ට්‍රේලියානු සංචාරයට සමගාමීව සංවිධානය කෙරුණි. විශාල තිරවල හා මෙල්බර්න් හා සිඩ්නි ක්‍රිකට් ක්‍රීඩාංගණයේ මායිම් තීරුවලද ප්‍රචාරණය ක්‍රියාත්මක විය.






# ජපානය

### JATA **සංචාරක ප්‍රදර්ශනය 2012 - ටෝකියෝ බිග් සයිඩ් - ජපානය - 2012 සැප්තැම්බර් 20-24**

රටවල් 156 කින් පාර්ශ්වකරුවන් සහභාගි වූ මෙයට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ද එක් විය.

### සමුද්‍ර කිමිදුම් උළෙල 2012 - සන්සයින් සිටි සෙන්ටර් - 2012 අප්‍රේල් 06 - 08

විවිධ රටවලින් පුද්ගලයින් 52,314 ක් සහභාගි වූ මෙයට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයද එක් වුණි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මෙහිදී ප්‍රවර්ධන භාණ්ඩයක් ලෙස කිමිදීම පිළිබඳ තොරතුරු ඇතුළත් පත්‍රිකා මුද්‍රණය කොට නරඹන්නන් අතර බෙදා හැර තිබේ.




### යොමුයුරි/දිනපතා යොමුයුරි, අසාහි, නිකෙයි පුවත්පත්වල වෙළඳ ප්‍රචාරණය -

2012 ජුනි 28 (යොමුයුරි)
2012 ජුලි 04 (අසාහි)
2012 ජුලි 11 (නිකෙයි)

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ඉහත පුවත් පත්වල සම්පූර්ණ පිටුවේ වෙළඳ දැන්වීම් පළ කළේය.






### කාන්තාවන්ට පමණයි දුම්රිය මැදිරියේ වෙළඳ ප්‍රචාරණය

### හිබියා, ටොසයි/ටෙයොකොසොකු, චියෝඩා, යුරකුචො, පුකුටොෂින්, හන්සොමොන් දුම්රිය මාර්ගවල - 2012 සැප්තැම්බර් 11 ඔක්තෝබර් 10

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ටෝකියෝ නගර සීමාවේ ඉහත දුම්රිය මාර්ග 06ක කාන්තාවන්ට වෙන් වූ මැදිරිවල විශේෂිත සංචරණ දැන්වීම් ප්‍රචාරණ වැඩසටහනක් දියත් කළේය.







# වැඩසටහන්

■ **යාපනය ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය.**

යාපනය දොරේඅප්පා ජාතික ක්‍රීඩාංගනයේදී මෙම ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය ජනවාරි 20 වැනිදා සිට 22 වැනිදා දක්වා පැවැත්විණ. අප ආයතනයද ඊට සහභාගි විය. ලක්‍ෂයකට අධික පිරිසක් එය නැරඹීමට පැමිණියහ.

■ **ආයුබෝවන් චයිනා - ඩ්‍රැගන් නයිට් - 2012 ජනවාරි 28**

චීන නව චන්ද්‍ර වර්ෂය සැමරීම සඳහා චීන සංස්කෘතික උත්සවය ලයිට් හවුස් ගැලී හිදී චීන හා ශ්‍රී ලංකා සංස්කෘතිකාංග සහිතව පවත්වන ලදී. එහි පහත සඳහන් දෑ අන්තර්ගත විය.

- චීන විශ්වවිද්‍යාල සිසුන් 50 දෙනෙකු විසින් ඉදිරිපත් කළ සංස්කෘතික අංගය
- ශ්‍රී ලංකා නාවුක හමුදාව මගින් ඉදිරිපත් කළ සම්ප්‍රදායික නැටුම හා සංගීත අංගය
- චීන හා ශ්‍රී ලාංකික ආහාර ප්‍රදර්ශනය
- ක්‍රියාකාරකම් කුටි, වෙළඳ කුටි, සමරු කුටි, ප්‍රවර්ධන කුටි, DJ, කැරෝකේ සහ සංගීතය
- පහන් කූඩු දැක්ම




■ **පාරිභෝගික පාදක වැඩමුළු - 2012 පෙබරවාරි 08**

අලෙවි ප්‍රවර්ධනයේදී චීන පාරිභෝගිකයන්ගේ චර්යා රටා පිළිබඳව ශ්‍රී ලාංකික සංචාරක ක්‍රියාකාරීන් හා සංචාරක නියෝජිතයින් දැනුවත් කිරීම.






■ **එක්ස්පෝ 2012 මාර්තු 28 සිට අප්‍රේල් 01 දක්වා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී.**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කළ එක්ස්පෝ 2012 ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයට අප ආයතනයද සහභාගි විය.







■ **ප්‍රෝ ගොල්ෆ් තරගාවලිය අගෝස්තු**

මෙම තරගාවලියෙහි සියලු සංවිධාන කටයුතු සිදුකරමින් පූර්ණ අනුග්‍රහය ලබාදුන්නේ ස්ටෑන්ඩඩ් චාර්ටඩ් ආයතනය විසිනි. 2012 අගෝස්තු පැවති මෙම තරගාවලියට ගොල්ෆ් ක්‍රීඩකයෝ සියයක් පමණ සහභාගි වූහ.






- **ලංකා චැලේන්ජ් ත්‍රිරෝද රථ මෙහෙයුම, අගෝස්තු -**

මෙවැනි ක්‍රියාකාරකමක් ශ්‍රී ලංකාවේ සංවිධානය කළ ප්‍රථම අවස්ථාව මෙයයි. මෙය සංවිධානය කළේ Connassiance de Ceylon ආයතනයයි. කණ්ඩායම් 25ක් මෙම අවස්ථාවට සහභාගි විය. මෙය ආවරණය කළ මාධ්‍ය කණ්ඩායමට අනුග්‍රහය දක්වමින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මෙයට සහාය දැක්වීය.




- **ලෝක සංචාරක දින උත්සවය 2012 සැප්තැම්බර් 27**

ලෝක සංචාරක දින උත්සවය නිමිති කොට 2012 සැප්තැම්බර් 27 දින මහනුවර හා කළුතර දී ක්‍රියාකාරකම් කිහිපයක් සංවිධානය කෙරුණි. ලෝක සංචාරක දිනයේ වැදගත්කම හා සංචාරක සංවර්ධනය උදෙසා තිරසාර බලශක්තිය මැයෙන් කලාපීය ආර්ථික සංවර්ධන ඒජන්සියේ (REDA) සහාය ඇතුව මහනුවර හෝටල් පාසල් පරිශ්‍රයේදී සම්මන්ත්‍රණයක් පැවැත්වුණි. තරුණ සත්වවේදීන්ගේ සංගමයේ සහායෙන් වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනක් කළුතර කැලිඩෝ වෙරළ තීරයේදී සිදුකරණ ලදී.




- **කොළඹ මැරතන් තරගය - 2012 ඔක්තෝබර්**

ලංකා ස්පෝර්ට්ස් රයිසන් ආයතනය ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහාය ඇතිව 2012 ඔක්තෝබර් 6 දින කොළඹ මැරතන් තරගය සංවිධානය කළේය. එහි ත්‍යාග සඳහා අනුග්‍රහය දැක්වූයේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයයි.





- 2012 මාර්තු 19 දින බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේදී ගමන් තොරතුරු කුටි 8ක් ආරම්භ කිරීම. සංචාරකයින්ට සංචරණ තොරතුරු සැපයීම මෙහි අරමුණයි.




- **දේශීය සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම. 2012 අප්‍රේල් 24 - දඹාන කොටබකිනිය ගම්මානයේදී**




- **මගී නෞකා පිළිගැනීම**

| යාත්‍රාවේ නම | කොළඹ වරායට පැමිණි දිනය | මගීන් සංඛ්‍යාව |
|---|---|---|
| ඕෂනියා නෝටිකා | ජනවාරි 17 - 18 | 700 |
| සිල්වර් විස්පර් | පෙබරවාරි 23 | 1,000 |
| අවුරෝරා | මාර්තු 14 | 1,950 |
| ක්වීන් එලිසබෙත් | මාර්තු 30 | 1,890 |






# මහජන සම්බන්ධතා හා මාධ්‍ය ප්‍රචාරණය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් පහත දැක්වෙන රටවල මාධ්‍යවේදීන්ට ආරාධනා කරනු ලැබුවේ ඔවුන් මගින් ශ්‍රී ලංකා සංචාරක ගමනාන්තය ලොව ප්‍රචලිත කරගැනීමේ අරමුණින්.

**2012 - මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන අදාළ රටවල සහභාගීත්වය**

| රට | මාධ්‍යවේදීන් ගණන |
|---|---|
| චීනය | 27 |
| එක්සත් රාජධානිය | 25 |
| බෙල්ජියම | 03 |
| ඉන්දියාව | 19 |
| පෝලන්තය | 08 |
| ෆින්ලන්තය | 02 |
| ජපානය | 02 |
| ජර්මනිය | 07 |
| තුර්කිය | 02 |
| ස්පාඤ්ඤය | 07 |
| රුසියාව | 29 |
| ඩුබායි | 07 |
| බහරේන් | 07 |
| මැලේසියාව | 14 |
| කොරියාව | 04 |
| ප්‍රංශය | 04 |
| ජෝර්දානය | 03 |
| තායිවානය | 06 |
| ඕමානය | 02 |
| සිංගප්පූරුව | 05 |
| ඉන්දුනීසියාව | 05 |
| පිලිපීනය | 03 |
| චෙක් ජනරජය | 02 |
| යුක්‍රේනය | 05 |
| ක්‍රොඒෂියාව | 02 |
| සර්බියාව | 01 |
| ඊජිප්තුව | 01 |
| හංගේරියාව | 01 |
| තායිලන්තය | 02 |
| සවුදි අරාබිය | 01 |
| ඇමරිකා එක්සත් ජනපදය | 03 |
| ඕස්ට්‍රේලියාව | 01 |
| බංගලාදේශය | 01 |
| ලෙබනනය | 01 |
| හොංකොං | 07 |
| නෙදර්ලන්තය | 05 |
| **මුළු ගණන** | **226** |



# 2012 ජාත්‍යන්තර මාධ්‍යවේදීන් පැමිණීමේ වැඩසටහන




මාධ්‍යවේදීන් මුළු ගණන - 226
FAM චාරිකා මුළු ගණන - 78
සහභාගි වූ රටවල් ගණන - 36

**2012 දී ලැබූ මාධ්‍ය ප්‍රචාරණයේ මුළු වටිනාකම**
**රු. 676,725,143.50**
**ඇ.ඩො. 5,143,801.148**

**2012 දී පැමිණි ප්‍රධාන මුද්‍රිත මාධ්‍ය හා රූපවාහිනී නාලිකා**

**චීනය**
- චයිනා ඩේලි
- ෆොටෝග්‍රැෆික් ට්‍රැවලර්
- ඉකොනොමික් ඩේලි
- ජියැංග්ෂි 7 නාලිකාව

**එක්සත් රාජධානිය**
- ද ට්‍රැවල් නාලිකාව
- ප්ලැනට් ඇපිටයිට් ඩේලි
- බීබීසී නැචුරල් වර්ල්ඩ්
- ද සන්
- ටීයූඅයි නාලිකාව

**ජර්මනිය**
- FERNWEH TV
- SWR 2/ BR 2 Radio
- Risen Exclusive

**ඉන්දියාව**
- ශ්‍රීදි ටෙලිවිස්ටාර්ස්
- මාතෘභූමි සඟරාව

**රුසියාව**
- VGTK My Planet Tv Channel
- නැෂනල් ජියොග්‍රැෆි රෂියා
- ඉන්ටර් ෆැක්ස් ප්‍රවෘත්ති ආයතනය

**ස්පාඤ්ඤය**
- Revista Vanitas
- La Razon

**ප්‍රංශය**
- පැට්‍රි ප්‍රඩක්ෂන්ස් ප්‍රංශය
- ග්ලෝබ් කුකර් ටීවී සීරීස්


travelife
Everywhere you want to
SCOTLAND
TAWI-TAWI
As you've never seen it before
THE BEST ROAD TRIPS
AUSTRALIA
Exploring the Great South
VENICE
The secret canals and alleys
AMAZING
SRI LANKA
Everything you need to know
Dinner in Modena
Sydney for Kids
Remembering old Beijing


DESTINATIONS OF THE WORLD
news
October 2012
SALVATORE FERRAGAMO
THAILAND
NEW IN TOWN
THE SUGAR ISLES
VANCOUVER
GOOD TASTE
Ceylon revisited


保存版ダイビングガイド
新たなムーヴメントの予感
スリランカ
SRI LANKA DIVE GUIDE


SABATO
COULISSE


摄影旅游
ROAM
N THE RAIL
道中慢行


旅行社
2012
TRAVEL AGENT
BTG


"ONE OF THE WORLD'S TOP 5 DESTINATIONS FOR 2012"
CONDE NAST TRAVELLER MAGAZINE
"HOME TO 8 WORLD HERITAGE SITES"
UNESCO
"NO. 1 TRAVEL DESTINATION OF THE YEAR!"
NEW YORK TIMES, 2010
"NO. 2 IN THE LIST OF TOP 20 TOURIST DESTINATIONS FOR 2010"
NATIONAL GEOGRAPHIC
"ONE OF THE TOP 6 DESTINATIONS FOR TRAVEL IN 2012"
NATIONAL GEOGRAPHIC TRAVELLER MAGAZINE
"ONE OF THE TOP 5 DESTINATIONS WHERE UK CUSTOMERS WANT TO SPEND THEIR HOLIDAY"
KUONI ANNUAL TRAVEL TRENDS REPORT
Refreshingly
srilanka
WONDER OF ASIA
www.srilanka.travel

# ශ්‍රී ලංකාව පිළිබඳ ජාත්‍යන්තර නියමයන්



"ශ්‍රී ලංකා - ආසියාවේ සැබෑම ආශ්චර්යයක්."
"2012 වසරේදී ශ්‍රී ලංකාව ලොව නැරඹිය යුතු හොඳම විදේශීය ගමනාන්ත පහ අතරට

- HELLO Magazine – UK

"2012 වසරේදී ලොව හොඳම ගමනාන්ත පහෙන් එකක්."
- Conde Nast Traveller Magazine





"2012 වසරේදී ලොව හොඳම ගමනාන්ත 20 ලැයිස්තුවේ දෙවැනි ස්ථානය"
- National Geographic Channel

"2012 වසරේදී, සංචාරය සඳහා හොඳම ගමනාන්ත 06 න් එකක්"
- National Geographic Traveler Magazine





"එක්සත් රාජධානියේ සංචාරකයින් සිය නිවාඩු ගත කිරීම සඳහා යාමට අපේක්ෂා කරන හොඳම ස්ථාන පහෙන් එකක්."
- KOUNI annual report

"ශ්‍රී ලංකාව වැය කරන මුදලට ඉහළ වටිනාකමක් ලබාදෙන ගමනාන්තයක්"
- Post Office Travel Money's 2012 Long Haul Holiday Report - UK





"2013 දී අංක එකේ සංචාරක ගමනාන්තය"
- Lonely Planet
(Top 10 Countries List)
(Declared in 2012)

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

# මූල්‍ය වාර්තාව - 2012

## ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
## 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | 2012 රුපියල් | 2011 රුපියල් |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන | 3 | 1,528,741,158.65 | 819,853,581.02 |
| ලැබිය යුතු | 4 | 481,324,185.60 | 340,609,153.97 |
| අත්තිකාරම් | 5 | 2,158,930.19 | 3,403,093.20 |
| පෙරගෙවීම් | 6 | 2,808,927.56 | 231,123.85 |
| ණය ගැතියෝ | 7 | 2,470,887.89 | 34,067,741.85 |
| තොගය | | 9,632,954.28 | 6,996,488.48 |
| | | 2,027,137,044.17 | 1,205,161,182.37 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, යන්ත්‍ර සහ උපකරණ | 8 | 14,206,290.25 | 15,485,923.32 |
| | | 14,206,290.25 | 15,485,923.32 |
| **මුළු වත්කම්** | | **2,041,343,334.42** | **1,220,647,105.69** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| පූර්ව ආදායම් | 9 | 11,456,793.25 | 5,585,302.75 |
| ගෙවීමට ඇති තැන්පතු | 10 | 663,267.59 | 552,667.74 |
| සේවක ප්‍රතිලාභ | 11 | 5,167,304.33 | 5,996,352.63 |
| උපචිත වියදම් | | 670,435,841.48 | 330,138,622.93 |
| ණයහිමියෝ | 12 | 24,425,221.80 | 25,388,355.74 |
| | | 712,148,428.45 | 367,661,301.79 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| දිගු කාලීන ණය | | - | - |
| | | - | - |
| **මුළු වගකීම්** | | **712,148,428.45** | **367,661,301.79** |
| **ශුද්ධ වත්කම්** | | **1,329,194,905.97** | **852,985,803.90** |
| **ශුද්ධ වත්කම්/ව්‍යාපාර ස්කන්ධය** | | | |
| ප්‍රාග්ධන දායකත්වය | | 33,069,156.52 | 33,069,156.52 |
| උපචිත අතිරික්ත/හිඟය | | 1,296,125,749.45 | 819,916,647.38 |
| **මුළු ශුද්ධ වත්කම්/ව්‍යාපාර ස්කන්ධය** | | **1,329,194,905.97** | **852,985,803.90** |

**එම්. එම්. ජේ. ආර්. එන්. ප්‍රනාන්දු**
මූල්‍ය අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

**බී. එස්. ගුණරත්න**
සභාපති
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
# 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
# මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

| | සටහන | 2012 රුපියල් | 2011 රුපියල් |
|---|---|---|---|
| **ආදායම** | | | |
| නාවාරෝහණ අධිභාරය | | 813,179,959.92 | 729,174,937.13 |
| සංචාරක සංවර්ධන අධිභාරය | | 566,312,922.14 | 454,839,489.53 |
| වෙනත් ආදායම් | 13 | 64,634,339.12 | 64,244,603.59 |
| **මුළු ආදායම්** | | **1,444,127,221.18** | **1,248,259,030.25** |
| **වියදම්** | | | |
| වේතන, වැටුප් හා සේවක ප්‍රතිලාභ | 14 | 28,630,428.07 | 25,892,216.97 |
| භාවිත කළ සැපයුම් සහ පාරිභෝගික භාණ්ඩ | 15 | 57,968,737.39 | 30,642,068.39 |
| ප්‍රවර්ධනයට අදාළ පිරිවැය - විදේශීය | 16 | 12,430,227.19 | 30,683,670.87 |
| ප්‍රවර්ධනයට අදාළ පිරිවැය - දේශීය | 17 | 863,953,765.69 | 584,620,324.40 |
| වෘත්තීය ආශ්‍රිත වාර්ෂික ක්ෂය | | 3,824,709.19 | 3,978,586.48 |
| වෙනත් වියදම් | 18 | 1,067,206.29 | 14,955,568.84 |
| මූල්‍ය පිරිවැය | 19 | 43,045.01 | 5,940,680.17 |
| **මුළු පිරිවැය** | | **967,918,118.83** | **696,713,116.12** |
| අදාළ කාලය සඳහා අතිරික්තය/(හිඟය) | | 476,209,102.35 | 551,545,914.13 |
| ඉදිරියට ගෙන ආ අතිරික්තය/(හිඟය) | | 819,916,647.10 | 268,370,733.25 |
| **ඉදිරියට ගෙන ආ අතිරික්තය/(හිඟය)** | | **1,296,125,749.45** | **819,916,647.38** |

# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
# 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
# සමස්ත වත්කම්/ව්‍යාපාර ස්කන්ධය

| | දායක වූ ප්‍රාග්ධනය රුපියල් | උපචිත අතිරික්තය/(හිඟය) රුපියල් | එකතුව රුපියල් |
|---|---|---|---|
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | 33,069,156.52 | 819,916,647.38 | 852,985,803.90 |
| අදාළ කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/(හිඟය) | - | - | - |
| ප්‍රති ප්‍රකාශනය | | (106,865,657.28) | (106,865,657.28) |
| 2011 දෙසැම්බර් 31 දිනට නැවත ප්‍රති ප්‍රකාශිත ශේෂය | 33,069,156.52 | 713,050,990.10 | 746,120,146.62 |
| අදාළ කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/(හිඟය) | - | 476,209,102.35 | 476,209,102.35 |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 33,069,156.52 | 1,189,260,092.45 | 1,222,329,248.97 |

| | |
|---|---|
| පෙර වසරේ ආදායම 6003/2012 වසර | (103,895.22) |
| පෙර වසරේ වියදම 7662/2012 වසර | 106,969,552.50 |
| වෙනස | 106,865,657.28 |

# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
# 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
# මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

| | 2012<br>රුපියල් | 2011<br>රුපියල් |
|---|---|---|
| **මෙහෙයුම් කාර්යයන් හේතුවෙන් සිදු වූ මූල්‍ය ප්‍රවාහ** | | |
| අතිරික්තය/(හිඟය) | 476,209,102.35 | 658,411,571.41 |
| **මුදල් නොවන කාර්යයන්** | | |
| ක්ෂයවීම | 3,824,709.19 | 3,978,586.48 |
| කාර්යමණ්ඩල ණය පොලිය | (72,214.13) | (68,503.38) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | (829,048.30) | 991,715.13 |
| විනිමය ලැබීම්/පාඩු | - | 42,924.00 |
| හානි හා කපා හැරීම් | - | 108,737.97 |
| අය විය යුතු දෑ (වැඩිවීම්)/අඩුවීම | (140,715,031.63) | 29,784,897.13 |
| අත්තිකාරම්වල (වැඩිවීම්)/අඩුවීම | 1,244,163.01 | (1,374,922.78) |
| පූර්ව ගෙවීම්වල (වැඩිවීම්)/අඩුවීම | (2,577,803.71) | 1,309,135.52 |
| ණයගැතියෝ (වැඩිවීම්)/අඩුවීම | 31,596,853.96 | (916,172.95) |
| තොග ලැයිස්තවල (වැඩිවීම්)/අඩුවීම | (2,636,466.08) | (3,472,068.99) |
| ලද ආදායම් වැඩිවීම/(අඩුවීම) | 5,871,490.50 | (1,831,756.96) |
| ගෙවිය යුතු තැන්පතු වැඩිවීම/(අඩුවීම) | 110,599.85 | (425,399.34) |
| උපචිත පිරිවැය වැඩිවීම/(අඩුවීම) | 340,297,218.57 | 184,404,972.86 |
| ණය හිමියෝ වැඩිවීම/(අඩුවීම) | (963,133.94) | (160,384,944.26) |
| කාර්යමණ්ඩල ණය පොලිය | 72,214.13 | 68,503.38 |
| **මෙහෙයුම් කාර්යයන් හේතුවෙන් සිදු වූ මූල්‍ය ප්‍රවාහය** | 711,432,653.77 | 710,616,511.20 |
| **ආයෝජන කාර්යයන් හේතුවෙන් සිදු වූ මූල්‍ය ප්‍රවාහය** | | |
| දේපළ යන්ත්‍ර සහ උපකරණ මිලට ගැනීම | (2,545,076.14) | (1,553,782.00) |
| **ආයෝජන කාර්යයන්ගෙන් සිදු වූ මුදල් ප්‍රවාහය** | (2,545,076.14) | (1,553,782.00) |
| **මූල්‍ය කාර්යයන්ගෙන් සිදු වූ මූල්‍ය ප්‍රවාහය** | | |
| ණය පියවීම | - | (66,666,666.68) |
| **මූල්‍ය කාර්යයන්ගෙන් සිදුවූ මූල්‍ය ප්‍රවාහය** | - | (66,666,666.68) |
| **මුදල් හා මුදල් සමානවල වැඩිවීම/(අඩුවීම)** | 708,887,577.63 | 642,396,062.52 |
| **කාලපරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල් සමාන** | 819,853,581.02 | 177,457,518.50 |
| **කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් සමාන** | 1,528,741,158.65 | 819,853,581.02 |

# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
# 2012 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 01. සංවිධානය පිළිබඳ විස්තර

### 1.1 සංස්ථාපනය

2007 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2005 අංක 38 දරන සංචාරක පනත ක්‍රියාත්මක කරනු ලැබිණි. 2007 ඔක්තෝබර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, නව ආයතන පහත සඳහන් පරිදි සංස්ථාපනය කර ඇත.

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
- ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
- ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය

### 1.2 සකස්කිරීමේ පදනම හා ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිති වගන්ති 1.1 ට නිදහස් කරන ලද ආයතනයන් ගනයට නොගැනේ. එබැවින් මෙම ගිණුම් ප්‍රකාශය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ප්‍රමිතිවලට අනුකූලව සකසා ඇත.

### 1.3 කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රමිතීන් යොදා ගැනීම පිළිබඳ කරුණු දැක්වීම

වර්ෂ 2012 සඳහා වූ මෙම මූල්‍ය වාර්තාව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ මූල්‍ය වාර්තා කරන ප්‍රමිති ප්‍රකාරව සැකසූ ප්‍රථම වාර්තාව වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලින් ව්‍යුක්ත වූ දිනය 2012 ජනවාරි 1 වන අතර 2011 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය භාවිත කර ඇත.

### 1.4 සංචාරක සංවර්ධන අරමුදල බෙදාහැරීම

සංචාරක ආඥා පනතේ 23(1) වගන්තියට අනුව සංචාරක සංවර්ධන අරමුදල ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය හා අලෙවි කිරීම සඳහා උපයෝගී කර ගත හැකිය. එම අරමුදල ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් කළමනාකරණය හා පරිපාලනය කරනු ලැබේ.

අරමුදල යෙදවීම සංචාරක ආඥා පනතේ 24(8) වගන්තියට අනුකූලව පහත ප්‍රතිශතයන්ට අනුව සිදුකරනු ලැබේ.

| දේශීය අධිකාරිය | යෙදවිය හැකි ප්‍රතිශතය |
|---|---|
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 14% |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 70% |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය | 12% |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | 4% |

### 1.5 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

ශ්‍රී ලංකාව එහි වූ සුන්දර වෙරළ තීර, උණුසුම් සහ සුහදශීලි ජනතාව සහ එය සතු අග්‍රගණ්‍ය ස්වභාවික, සංස්කෘතික සහ වික්‍රමාන්විත අත්දැකීම් සමග ආසියාවේ සංචාරක සංධිස්ථානය බවට පත්කර එය සංචාරක කර්මාන්තයේ පාර්ශවකරුවන් සඳහා මෙන්ම ශ්‍රී ලංකාවාසී ජනතාවටද ප්‍රතිලාභ ලබාදෙන විශාලතම විදේශ විනිමය සපයන්නා වශයෙන් සංවර්ධනය කර ශ්‍රී ලංකාව ආසියාවේ ප්‍රමුඛතම සහ හරිත වර්ණයෙන් සපිරුණු දිවයිනක් වශයෙන් ස්ථාපිතකොට ස්ථානගත කිරීම.

### 1.6 සේවකයන් සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 වන විට සමස්ත සේවක සංඛ්‍යාව 41 ක් විය.

### 1.7 මූලික මිනුම් දඬු

මූල්‍ය ප්‍රකාශන සකස්කොට ඇත්තේ ඓතිහාසික පිරිවැය සම්මුතීන්ට අනුකූලවය.

### 1.8 ඉදිරිපත් කරන මුදල් ඒකකය

සියලු මූල්‍ය ප්‍රකාශන සකස්කොට ඇත්තේ වර්තමානයේ භාවිත වන මූල්‍ය ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලිනි.

### 1.9 ඇස්තමේන්තු සහ තීරක යොදා ගැනීම

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති මූල්‍ය ප්‍රකාශන හේතුවෙන්, ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වලට අදාළ වන තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන ගැනීමට කළමනාකාරිත්වයට සිදුවේ. සත්‍ය ප්‍රතිඵල මෙකී ඇස්තමේන්තුවට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ මූලික උපකල්පන නිත්‍ය පදනමින් අගයනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කරනු ලබන කාලයේදී එකී කාලයට සහ ඉන් බලපෑම් විය හැකි ඉදිරි කාලය සඳහා වන ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධනය හඳුනා ගැනේ. මූල්‍ය ප්‍රකාශනයන්හි සඳහන් මිල ගණන් සම්බන්ධයෙන් වඩාත් බලපෑම් ඇතිවිය හැකි ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී තීරණාත්මක කරුණු පිළිබඳව තොරතුරු සහ ඉදිරියේදී ද්‍රව්‍යමය ගැලපීම් සම්බන්ධයෙන් සැලකිය යුතු තීරණ සහිත අවිනිශ්චිත ඇස්මේන්තු අදාළ සටහන්වල ඇතුළත් කර ඇත.

### 1.10 මූල්‍ය ප්‍රකාශන කළමනාකාරීත්වය සම්බන්ධයෙන් වගකීම් දැරීම

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙකී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ සාධාරණව ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකාරීත්වය විසින් දරනු ලබයි. මෙකී වගකීමට වංචනිකභාවය හෝ වැරදීම් හේතුවෙන් වැරදි ලෙස ප්‍රකාශ නොවන මූල්‍ය ප්‍රකාශන සැකසීමේ සහ සාධාරණව ඉදිරිපත් කිරීමට අදාළ අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම, සුදුසු ගණකාධිකරණ ප්‍රතිපත්ති තෝරාගැනීම, ක්‍රියාත්මක කිරීම සහ අවස්ථානුකූලව සාධාරණ ගිණුම්කරණ ඇස්තමේන්තු සකස්කිරීම මෙයට අයත් වේ.

### 1.11 ශේෂ පත්‍රයේ දිනට පසු අවස්ථා

ශේෂ පත්‍රය ඉදිරිපත් කරන දිනට පසුව යෙදුණු සියලුම බහුතික අවස්ථා සැලකිල්ලට ගනු ලැබූ අතර, සුදුසු යතාවත් කිරීම්/අනාවරණ කිරීම් අවශ්‍යතාව පරිදි මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කර තිබේ.

### 1.12 තුලනාත්මක තොරතුරු

අවශ්‍ය අවස්ථාවල ඇතැම් තුලනාත්මක ගණනයන් කාලීන වසරේ ඉදිරිපත් කිරීමට සමානුරූපීව යළි වර්ගීකරණය කොට ඇත. (සටහන් අංක 20 බලන්න)

## 02. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 භාණ්ඩ ලැයිස්තු

භාණ්ඩ තොග, පිරිවැය මත හෝ ඒවා විකුණා ලබා ගත හැකි මුදල යන, මින්කවර හෝ අඩු අගය මත තක්සේරු කරනු ලැබේ.

### 2.2 ක්ෂය වීම.

ක්ෂය වීම් ප්‍රතිපාදනය ගණනයකොට ඇත්තේ දේපළ, යන්ත්‍ර හා උපකරණවල තථ්‍ය පිරිවැය හෝ තක්සේරු වටිනාකම් සෘජු රේඛීය ලෙස පදනම් කර ගනිමිනි. එවැනි පිරිවැය තක්සේරුව, කපාහැරීම සිදුකරන්නේ අත්පත් කර ගත් දින සිට ගෙවුණු කාලය ඇස්තමේන්තු කර ගනිමින් පහත සඳහන් පරිදිය.

| විස්තරය | අනුපාතිකය |
|---|---|
| ගෘහ භාණ්ඩ හා උපාංග | 7.5% |
| පරිගණක උපකරණ | 25% |
| රථ වාහන | 25% |
| වායුසමීකරණ යන්ත්‍ර | 7.5% |
| කාර්යාල උපකරණ | 7.5% |
| දුරකථන | 7.5% |
| විවිධ උපකරණ | 7.5% |
| පරිගණක මෘදුකාංග | 7.5% |
| ගොඩනැගිලි සංවර්ධනය කිරීම | 10% |

### 2.3 දේපළ, යන්ත්‍ර සහ උපකරණ

දේපළ, යන්ත්‍ර හා උපකරණ අයිතම උපචිත ක්ෂයවීම සහ උපචිත හානි/පාඩුවලට වඩා අඩු පිරිවැයකට ගණනය කර ඇත. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ගොඩනැගිල්ල අයත්වන්නේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියටයි.

### 2.4 විදේශ මුදල් ගනුදෙනු

මෙම ගනුදෙනු පහත අනුපාතිකයන්ට අනුව පරිවර්තනය කරනු ලැබේ.

| | |
|---|---|
| ලැබීම් හා ගෙවීම් | - තථ්‍ය අනුපාතිකය |
| ජංගම වත්කම් හා වගකීම් | - පියවීම් අනුපාතිකය |
| ස්ථාවර වත්කම් | - ආසන්න අනුපාතිකය |
| ප්‍රේෂණ | - තථ්‍ය අනුපාතිකය |

### 2.5 අදාළ පාර්ශ්ව ගනුදෙනු

සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුව අදාළ පාර්ශ්වවල හෙළි කළ යුතු තරමේ ගනුදෙනු සිදු වී නොමැත.

### 2.6 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

ආයතනයෙහි වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින්ට 1983 අංක 12 දරන පාරිතෝෂික ආඥා පනතේ වගන්ති ප්‍රකාර පූර්ණ පාරිතෝෂික දීමනාවක් ගෙවීමට ප්‍රතිපාදන සපයයි.

## 2.7 උපචිත වියදම්

ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව උපචිත වියදම් ලෙස අර්ථ විවරණය කර ඇත්තේ සැපයුම්කරු සමග එකඟ වූ පරිදි සපයා හෝ ලැබී ඇති එහෙත් මුදල් ගෙවා නොමැති භාණ්ඩ හා සේවා පිළිබඳ වගකීම්ය. එබැවින් ගෙවිය යුතු ගණන ලෙස IIFA හි සඳහන් මුදල ඉහත අර්ථ විවරණයට අනුව උපචිත වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

## 2.8 බදු අයකිරීම

1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 (අ) වගන්තිය මගින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ආදායම් බදු අයකර ගැනීමෙන් නිදහස් කරන ලදී. කෙසේ නමුත් 2002 අංක 10 දරන දේශීය ආදායම් බදු සංශෝධන පනත ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ආපසු එවුම් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

## 2.9 වෙනත් ආදායම්

අනෙකුත් සියලු ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ. වෙළඳ දායකත්වය මගින් දැක්වෙන්නේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින් සංවිධිත විදේශ වෙළඳ ප්‍රදර්ශනයන්ට සහභාගීවූවන්ගෙන් පිරිවැය අයකර ගනු ලැබීමය.

## 2.10 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ "මුදල් ප්‍රවාහ ප්‍රකාශ" ප්‍රමිතිය මත පදනම්ව මුදල් ප්‍රවාහ සකස් කිරීමේ "වක්‍ර ක්‍රමවේදය" යොදා ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරන ලදී. මුදල් සහ මුදල් සමාන සමන්විත වන්නේ ප්‍රසිද්ධ මුදල්වලට හැරවිය හැකි සහ අගයේ වටිනාකම වෙනස්වීම සම්බන්ධයෙන් අවදානම් අඩු කෙටි කාලීන සහ ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු ආයෝජනයයි. අත ඇති මුදල් සහ බැංකුවේ ඇති ශේෂයන්ගෙන් මුදල් සහ මුදල් සමාන සමන්විතය.

## 2.11 අත්තිකාරම්

පහත දැක්වෙන අත්තිකාරම් ජංගම වත්කම් ලෙස පෙන්වා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| 1. විදේශීය අත්තිකාරම් | රු. | 20,730.19 |
| 2. දේශීය අත්තිකාරම් | රු. | 2,138,200.00 |
| **එකතුව** | **රු.** | **2,158,930.19** |

මෙතෙක් නොපියවූ අත්තිකාරම් රුපියල් 1,575,000 මුදලක් දේශීය අත්තිකාරම් ලෙස ඇතුළත් කර තිබේ. ( IIFA වියදම් පියවා නොමැති වීම හේතුවෙන් )

# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 03.0 මුදල් හා මුදල් සමාන ද්‍රව්‍ය

| විස්තරය | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| බැංකුවේ ඇති මුදල - ප්‍රධාන කාර්යාලය - ප්‍රධාන ගිණුම | 1,293,691,266.25 | 728,520,593.19 |
| බැංකුවේ ඇති මුදල - ප්‍රධාන කාර්යාලය - පුද්ගලික අංශය | 154,002,458.84 | 85,980,601.90 |
| බැංකුවේ ඇති මුදල - මහනුවර - TIC | 396,906.71 | 391,507.68 |
| බැංකුවේ ඇති මුදල - බැංකු මාරු කිරීම් | - | 5,105,096.42 |
| විදේශ කාර්යාලය - එක්සත් රාජධානිය | 9,566.22 | (222,918.53) |
| විදේශ කාර්යාලය - ඉන්දියාව | 78,700.36 | 78,700.36 |
| බැංකු ප්‍රේෂණය - එක්සත් රාජධානිය | 17,834,454.93 | - |
| මාර්ගස්ථ මුදල් | 62,727,805.34 | - |
| **මුළු මුදල් හා මුදල් සමාන ද්‍රව්‍ය** | 1,528,741,158.65 | 819,853,581.02 |

## 04.0 ලැබීම්

| විස්තරය | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| පාරිභෝගික පොත්පිංච - එක්සත් රාජධානිය | 2,428,920.00 | 2,428,920.00 |
| ඉන්ධන තැන්පතු | 100,000.00 | 100,000.00 |
| වාහන කුලී තැන්පතු | 20,000.00 | 20,000.00 |
| හික්කඩුව ප්‍රවේශ පත්‍ර | 876,000.00 | 876,000.00 |
| ATM 2011 ස්ථාපිත පිරිවැය | 1,807,792.08 | 1,807,792.08 |
| ජල සැපයුම (ඇමෙරිකන් ප්‍රිමියම්) | 4,000.00 | - |
| ICLP බේරුම්කරණ මධ්‍යස්ථානය | 25,000.00 | - |
| 2011 ලෝක කුළු බඩු ආහාර ප්‍රදර්ශනය අනුග්‍රාහකත්වය | - | 750,000.00 |
| නැව් නැගීමේ අධිභාරය | 198,536,592.93 | 123,461,589.83 |
| කටුනායක කුලිය සඳහා බැංකු සහතිකය | 1,286,392.31 | - |
| සංචාරක සංවර්ධන අධිභාරය | 275,909,488.28 | 211,152,119.56 |
| දේපළ මූල්‍ය සහ ආයෝජන මහනුවර | 330,000.00 | |
| වෙනත් | - | 12,732.50 |
| **මුළු ලැබීම්** | 481,324,185.60 | 340,609,153.97 |

## 05.0 අත්තිකාරම්

| විස්තරය | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| දේශීය අත්තිකාරම් | 2,138,200.00 | 2,005,987.50 |
| විදේශීය අත්තිකාරම් | 20,730.19 | 1,397,105.70 |
| **මුළු අත්තිකාරම්** | 2,158,930.19 | 3,403,093.20 |

## 06.0 පෙර ගෙවීම්

| විස්තරය | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| සේවා ගිවිසුම | 53,633.87 | - |
| මූල්‍ය දායකත්වය | 1,426,411.05 | 56,304.78 |
| වාර්ෂික සාමාජිකත්වය - එක්සත් රාජධානිය | 1,328,882.64 | 174,819.07 |
| **මුළු පූර්ව ගෙවීම්** | 2,808,927.56 | 231,123.85 |

## 07.0 ණයගැතියන්

| විස්තරය | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| ණයගැතියන් - SLTDA | 16,292.89 | 31,141,767.55 |
| ණයගැතියන් - SLITHM | - | 658,734.30 |
| සේවකයන් - ණය හා අත්තිකාරම් | 2,454,595.00 | 2,267,240.00 |
| වෙනත් ණයගැතියන් | - | - |
| **මුළු ණයගැතියන්** | 2,470,887.89 | 34,067,741.85 |

# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මූල්‍ය ප්‍රකාශන සටහන්

## 08.0 දේපළ, යන්ත්‍ර හා උපකරණ

| විස්තරය | 2012.01.01 දිනට ශේෂය රුපියල් | එකතු කිරීම් 2012 රුපියල් | මාරුකිරීම් 2012 රුපියල් | 2012.12.31 දිනට ශේෂය රුපියල් | 2012.01.01 දිනට එකතු වූ ක්ෂයවීම රුපියල් | 2012 සඳහා ක්ෂයවීම රුපියල් | ක්ෂය කළ හැකි බැහැර කිරීම් 2012 රුපියල් | 2012.12.31 දිනට එකතු වූ ක්ෂයවීම් රුපියල් | 2012.12.31 දිනට ශුද්ධ පොත් වටිනාකම රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|---|
| ගොඩනැගිලි සංවර්ධන පිරිවැය | | | | - | - | - | | - | - |
| ගෘහ භාණ්ඩ හා උපාංග | 8,532,531.89 | 632,153.14 | - | 9,164,685.03 | 2,362,453.00 | 664,199.14 | - | 3,026,652.14 | 6,138,032.89 |
| දුරකථන | 707,823.00 | 61,216.00 | - | 769,039.00 | 79,598.96 | 55,715.66 | - | 135,314.62 | 633,724.38 |
| පරිගණක උපකරණ | 9,179,033.81 | 1,695,171.00 | - | 10,874,204.81 | 6,955,806.72 | 1,520,973.58 | - | 8,476,780.30 | 2,397,424.51 |
| කාර්යාල උපකරණ | 2,982,522.50 | 151,616.00 | - | 3,134,138.50 | 678,326.29 | 278,875.24 | - | 957,201.53 | 2,176,936.97 |
| රථ වාහන | 7,400,000.00 | - | - | 7,400,000.00 | 5,150,000.00 | 1,125,000.00 | - | 6,275,000.00 | 1,125,000.00 |
| පරිගණක මෘදුකාංග | 867,750.00 | - | - | 867,750.00 | 194,106.71 | 65,081.25 | - | 259,187.96 | 608,562.04 |
| වායුසමීකරණ යන්ත්‍ර | 717,900.00 | - | - | 717,900.00 | 94,767.15 | 53,842.50 | - | 148,609.65 | 569,290.35 |
| විවිධ උපකරණ | 809,135.35 | 4,920.00 | - | 814,055.35 | 195,714.42 | 61,021.82 | - | 256,736.24 | 557,319.11 |
| **එකතුව** | **31,196,696.55** | **2,545,076.14** | **-** | **33,741,772.69** | **15,710,773.25** | **3,824,709.19** | **-** | **19,535,482.44** | **14,206,290.25** |

# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 09.0 අත්තිකාරම් ආදායම

| විස්තරය | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| විදේශීය වෙළඳ ප්‍රදර්ශනය | 11,456,793.25 | 5,585,302.75 |
| **මුළු අත්තිකාරම් ආදායම** | **11,456,793.25** | **5,585,302.75** |

## 10.0 ගෙවිය යුතු තැන්පතු

| විස්තරය | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| ආපසු ගෙවන ප්‍රසම්පාදන තැන්පතු | 337,080.00 | 353,080.00 |
| ගෙවිය යුතු රඳවාගැනීම් | 193,553.40 | 193,553.40 |
| වෙනත් | 132,634.19 | 6,034.34 |
| **ගෙවිය යුතු මුළු තැන්පතු** | **663,267.59** | **552,667.74** |

## 11.0 සේවක ප්‍රතිලාභ

| විස්තරය | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| ඉදිරියට ගෙන ආ විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 5,996,352.63 | 5,004,637.50 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 1,172,641.95 | 991,715.13 |
| ගෙවූ පාරිතෝෂික හා පෙර වසරේ | 2,001,690.25 | - |
| **මුළු සේවක ප්‍රතිලාභ** | **5,167,304.33** | **5,996,352.63** |

## 12.0 ණයහිමියෝ

| විස්තරය | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| ණය හිමියෝ - SLTDA | 24,371,042.80 | 25,334,176.74 |
| ණය හිමියෝ - SLITHM | 54,179.00 | 54,179.00 |
| **මුළු ණයහිමියෝ** | **24,425,221.80** | **25,388,355.74** |

## 13.0 වෙනත් ආදායම්

| විස්තරය | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| සාහිත්‍ය හා ඡායාරූප ද්‍රව්‍යවලින් ලැබූ ආදායම | - | 86,900.00 |
| පොලියෙන් ලැබූ ආදායම - සේවක ණය | 72,214.13 | 68,503.38 |
| වෙළඳ දායකත්වය | 61,772,544.03 | 59,722,990.34 |
| වෙනත් | 2,789,580.96 | 4,366,209.87 |
| **මුළු වෙනත් ආදායම්** | **64,634,339.12** | **64,244,603.59** |

## 14.0 වේතන, වැටුප් හා සේවක ප්‍රතිලාභ

| විස්තරය | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| වැටුප් හා දීමනා | 19,128,500.08 | 18,197,058.94 |
| නිවාඩු දින දීමනා | 30,100.74 | 53,876.25 |
| අතිකාල | 458,800.29 | 640,611.94 |
| සේවක අර්ථක සාධක අරමුදලට දායකත්වය | 1,727,656.32 | 1,995,798.39 |
| සේවක භාරකාර අරමුදලට දායකත්වය | 356,474.10 | 400,057.85 |
| කාර්ය මණ්ඩල සුබසාධනය සහ පැමිණීමේ දිරි දීමනා | 2,575,585.63 | 2,314,418.32 |
| ගමන් වියදම් - දේශීය | 77,303.00 | 35,372.00 |
| කාර්ය මණ්ඩලයේ නිල ඇඳුම් | 40,873.60 | 145,461.00 |
| පාරිතෝෂික | 1,184,634.20 | 917,312.13 |
| රක්ෂණ | 2,028,787.44 | 696,531.25 |
| කාර්ය මණ්ඩල පුහුණුකිරීම් | 1,021,712.67 | 495,718.90 |
| **මුළු වේතන, වැටුප් හා සේවක ප්‍රතිලාභ** | **28,630,428.07** | **25,892,216.97** |

## 15.0 සැපයීම් හා භාවිත පාරිභෝගික ද්‍රව්‍ය

| **විස්තරය** | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| විවිධ සැපයීම් | 60,640.00 | 84,505.00 |
| ලිපි ද්‍රව්‍ය | 1,166,786.48 | 1,150,805.98 |
| දුරකථන හා අන්තර්ජාල | 1,686,566.09 | 1,646,812.13 |
| තැපැල්, කුරියර් හා මුද්දර ගාස්තු | 4,385,964.26 | 2,674,171.86 |
| ගොඩනැගිලි කුලිය | 18,128,284.26 | 11,185,034.86 |
| විදුලිය | 3,822,357.21 | 3,240,751.64 |
| නඩත්තුව - උපකරණ | 1,995,596.65 | 2,749,896.98 |
| ප්‍රචාරණය - පොදු | 14,308,046.28 | 194,790.00 |
| නඩත්තුව හා අලුත්වැඩියාව - වාහන | 1,281,033.85 | 1,133,562.42 |
| වාහන කුලියට ගැනීම | 6,591,906.70 | 2,191,533.95 |
| ජලය | 233,338.93 | 1,036,670.88 |
| පොත් සහ වාර සඟරා | 264,437.40 | 111,312.50 |
| ඉන්ධන වියදම් | 1,055,710.21 | 779,502.25 |
| විනෝද කටයුතු - දේශීය | 113,072.77 | 100,913.07 |
| පිරිසිදුකිරීම් සපයන්නෝ | 1,627,631.90 | 1,057,238.22 |
| ආරක්ෂාව | 874,209.61 | 445,678.86 |
| නඩත්තුව - ගොඩනැගිලි | 256,084.79 | 613,347.79 |
| වරිපනම් හා බලපත්‍ර | 11,100.00 | 5,430.00 |
| මල් | 105,970.00 | 240,110.00 |
| **මුළු සැපයීම් හා භාවිත පාරිභෝගික ද්‍රව්‍ය** | **57,968,737.39** | **30,642,068.39** |

## 16.0 වෘත්තීය ආශ්‍රිත වියදම් - විදේශීය

| **විස්තරය** | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| පරිපාලනය - එක්සත් රාජධානිය | 12,430,227.19 | 30,683,670.87 |
| **මුළු වෘත්තීය ආශ්‍රිත වියදම් - විදේශීය** | **12,430,227.19** | **30,683,670.87** |

## 17.0 වෘත්තීය ආශ්‍රිත වියදම් - දේශීය

| **විස්තරය** | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| ප්‍රවර්ධන හා ප්‍රචාරණය - විදේශීය | 556,578,143.86 | 172,864,586.00 |
| දේශීය දැනුවත් කිරීමේ වැඩසටහන් | 7,443,824.35 | 40,419,731.65 |
| ප්‍රවර්ධන හා ප්‍රචාරණය | 4,266,603.90 | 94,249,785.34 |
| සංචාරක සන්නිවේදන ද්‍රව්‍ය නිෂ්පාදනය | 37,499,307.96 | 44,900,122.83 |
| වැඩසටහන් | 44,653,294.32 | 44,798,652.93 |
| VJP හා වෘත්තීය දැනුවත් කිරීම් චාරිකා | 26,438,483.74 | 21,690,255.50 |
| රඳවා ගැනීම් ගාස්තු | - | 22,737,070.92 |
| කළමනාකරණ ගාස්තු සහ කලා කටයුතු | 5,033,408.00 | 5,464,671.05 |
| අලෙවි සමීක්ෂණ | 84,386,307.79 | 1,170,961.03 |
| වෙළඳ ප්‍රදර්ශන - ITB | 32,565,827.37 | 32,412,178.74 |
| වෙළඳ ප්‍රදර්ශන - WTM | 29,868,208.62 | 35,360,792.60 |
| වෙබ් නඩත්තුව සහ ඊ නිව්ස් | 1,693,973.42 | 1,098,432.46 |
| Visit Sri Lanka | - | 23,701,445.29 |
| ආගන්තුකයින් සඳහා පහසුකම් සහ ආකර්ශනය | 9,502,353.04 | 41,606,046.00 |
| විනිමය ලැබීම්/පාඩු | | 42,924.00 |
| මෙහෙයුම් සමග ක්‍රියාකිරීම | 24,024,029.32 | 2,102,668.06 |
| **මුළු වෘත්තීය ආශ්‍රිත වියදම් - දේශීය** | **863,953,765.69** | **584,620,324.40** |

## 18.0 වෙනත් වියදම්

| විස්තරය | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| මණ්ඩල සාමාජික දීමනා | 153,982.48 | 339,636.87 |
| ප්‍රසම්පාදන කමිටු සාමාජික දීමනා | 122,050.00 | 65,500.00 |
| විගණන ගාස්තු | 400,000.00 | 665,360.00 |
| නීති ගාස්තු | 369,593.81 | 2,316.00 |
| මුද්දර ගාස්තු | 21,580.00 | 12,500.00 |
| පාඩු සහ කපාහැරීම් | - | 108,737.97 |
| අගය එකතු කළ බද්ද | - | 11,495,693.39 |
| ජාතික වෙළඳ බද්ද | - | 2,265,824.61 |
| **මුළු වෙනත් වියදම්** | **1,067,206.29** | **14,955,568.84** |

## 19.0 මූල්‍ය පිරිවැය

| විස්තරය | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| IIFA ණය පොලිය සහ බැංකු ගාස්තු | - | 5,722,138.69 |
| හර බද්ද | - | 172,943.48 |
| බැංකු ගාස්තු | 43,045.01 | 45,598.00 |
| **මුළු මූල්‍ය පිරිවැය** | **43,045.01** | **5,940,680.17** |

## 20.0 තුලනාත්මක තොරතුරු

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | කලින් සඳහන් ශේෂය 31.12.2011 රුපියල් | යාවත් කිරීම 2012 රුපියල් | යළි සඳහන් ශේෂය 31.12.2012 රුපියල් |
|---|---|---|---|
| වත්කම්<br>ජංගම වගකීම් | | | |
| සමුච්ත වියදම | 223,272,965.65 | 106,865,657.28 | 330,138,622.93 |
| මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය<br>ආදායම | | | |
| වෙනත් මුළු ආදායම | 64,244,678.25 | (74.66) | 64,244,603.59 |
| වියදම | | | |
| වේතන වැටුප් හා සේවක ප්‍රතිලාභ | 26,121,005.89 | (228,788.92) | 25,892,216.97 |
| සැපයුම් හා භාවිත පාරිභෝගික ද්‍රව්‍ය | 31,537,697.61 | (895,629.22) | 30,642,068.39 |
| වෘත්තීය ආශ්‍රිත වියදම් - විදේශීය | 30,805,777.48 | (122,106.61) | 30,683,670.87 |
| වෘත්තීය ආශ්‍රිත වියදම් - දේශීය | 477,546,792.44 | 107,073,531.96 | 584,620,324.40 |
| වෙනත් වියදම් | 14,612,648.09 | 342,920.75 | 14,955,568.84 |
| මූල්‍ය පිරිවැය | 5,245,025.51 | 695,654.66 | 5,940,680.17 |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல / My No: ටීඑම්/කේ/එස්එල්ටීපීබී/එෆ්ඒ/2012

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date: 2013 නොවැම්බර් 29 දින.

සභාපති,

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කාර්යාංශයේ සභාපති වෙත 2013 අගෝස්තු 21 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍යම පරිමාන ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බව මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

2.2.1 කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.ගි.ප්‍ර) අනුකූල නොවීම්

---------------------------------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විෂයය | ශ්‍රී.ලං.ගි.ප්‍ර. වලට යොමුව | අවශ්‍යතාවය | අනුකූල නොවීම |
|---|---|---|---|
| -------- | --------------- | --------------- | ------------------ |
| ඉන්වෙන්ට්‍රි | කු.ම.ප.ව්‍යා. සඳහා වූ ශ්‍රී.ගි.ප්‍ර. වල 13 වගන්තිය. | ආයතනය විසින් වටිනාකම ගණනය කිරීමේදී ඉන්වෙන්ට්‍රිවල අවම පිරිවැය සහ ඇස්තමේන්තුගත විකුණුම් පිරිවැය යන දෙකින් විකිණීමට හෝ සම්පූර්ණ කිරීමට අදාල අඩු පිරිවැයට ගණනය කල යුතුය. | (i) රු. 2,034,054 ක් වටිනා නිශ්චල විෂයයන් 27 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.<br><br>(ii) 2012 වර්ෂයට අදාල රු. 419,556 ක් වටිනා කළමනාකරණ දින පොත් ඉන්වෙන්ට්‍රිවල ඇතුලත් කර තිබුණි. |

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිත්‍යාග වශයෙන් දක්වනවා වෙනුවට රු. 1,128,000 ක් වූ පරිත්‍යාග වෙළඳ කටයුතු වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2010 ඔක්තෝබර් 11 දිනැති අංක මු.ක. අ/1/2010/01 දරන චක්‍රලේඛයේ නියමයන්ට පටහැනිව රු. 149,265 ක් වූ විදේශ ගමන් දීමනාවක් වැරදි ලෙස ගණනය කිරීම හේතු කොටගෙන නිලධාරියෙකුට වැඩිපුර ගෙවා තිබුණි.

2.2.3 නොසැසඳු පාලන ගිණුම්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| පාලන ගිණුම්වල විස්තරය | ගිණුම් අනුව ශේෂය | උපයෝගී වාර්තා වල විස්තරය | උපයෝගී වාර්තා අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| | රු. | | රු. | රු. |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු | 24,371,043 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අවසාන ගිණුම | 26,948,539 | 2,577,496 |
| ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයට ගෙවිය යුතු | 54,179 | ශ්‍රීලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයේ අවසන් ගිණුම | 44,484 | 9,695 |
| ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයට ගෙවිය යුතු | - නැත - | ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයේ අවසාන ගිණුම | 4,417,949 | 4,417,949 |

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 සහ 2008 වර්ෂවලට අදාලව පිළිවෙලින් රු. 2,827,822 ක් සහ රු. 8,980,922 ක් වූ ණය හිමියන් පියවා නොතිබුණි.

(ආ) ඉන්දියානු චිත්‍රපට ඇකඩමි සම්මාන උළෙලේ සංවිධායක ආයතනයෙන් ලැබිය යුතු මුදල් එම ආයතනයෙන් ලැබිය යුතු මුදල් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. විගණනයට ඉදිරිපත් කල තොරතුරුවලට අනුව, ඉහත ආයතනය වෙනුවෙන් කාර්යාංශය ලබා දී තිබුණු හෝටල් කාමර පහසුකම් වෙනුවෙන් එම ආයතනයෙන් දළ වශයෙන් රු. මිලියන 20 ක් අයකර ගත යුතුව තිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

ගිණුම්වල පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| | විස්තරය | වටිනාකම | නොසැපයූ සාක්ෂි |
|---|---|---|---|
| | ---------- | ----------- | -------------------- |
| | | රු. | |
| (අ) | බාහිර වාර්තාකරුවන්ගේ වැඩ සටහන | 26,438,483 | පවත්වන ලද වැඩ සටහන් සංඛ්‍යාව සහ මාධ්‍ය ප්‍රකාශන සම්බන්ධව තොරතුරු |
| (ආ) | වෙළඳ ප්‍රදර්ශන- International Travel Borse | 32,565,827 | විස්තරාත්මක උපලේඛන |
| (ඇ) | වෙළඳ ප්‍රදර්ශන - ලෝක සංචාරක වෙළඳපල | 29,868,208 | විස්තරාත්මක උපලේඛන |
| (ඈ) | විදේශ කටයුතු අංශය මගින් දරන ලද ප්‍රවර්ධන වියදම් | 55,427,296 | ඉන්වොයිස් |
| (ඉ) | කලින් ගෙවීම් | 2,808,927 | තහවුරු කිරීම |
| (ඊ) | ලැබිය යුතු ගිණුම් | 481,324,185 | තහවුරු කිරීම |
| (උ) | ඉන්වෙන්ට්‍රි | 291,912 | භෞතික සත්‍යාපන වාර්තා |

## 2.2.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2005 අංක 38 දරන සංචාරක පනතේ VII පරිච්ඡේදයේ 40 වගන්තියේ 09 උප වගන්තිය. | සෑම ලිත් වර්ෂයක් අවසානවී මාස තුනක් ඉකුත් වීමට පෙරාතුව ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙත පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කර නොතිබුණි.<br><br>(අ) ලිත් වර්ෂයේ මාස හතක් අවසාන වීමට පෙරාතුව අර්ධ වාර්ෂික ගිණුම්වල පිටපතක්<br>(ආ) පෙර වර්ෂයට අදාලව ඉදිරිපත් කරන ලද සැලසුම් සම්බන්ධයෙන් වූ කාර්ය සාධනය සහ ඉෂ්ඨ කර ගැනීම් ඇතුලත් ප්‍රකාශයන් |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ චක්‍රලේඛය. | |
| (i) 5 පරිච්ඡේදයේ 5.1.3 වගන්තිය | මුදල් වර්ෂය ආරම්භවීමට අවම වශයෙන් දින 15 වකට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කල යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මේ පිටපතක් විගණකාධිපති වෙත එවිය යුතුය. කෙසේ වුවද, මේ නියමයන්ට අනුකූල වීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි. |
| (ii) 9 පරිච්ඡේදයේ 9.12 වගන්තිය. | ව්‍යාපාර විසින් පිහිටුවනු ලබන ඕනෑම සුභසාධක යෝජනා ක්‍රමයක් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය. කෙසේ වුවද, සේවක වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය වන අනුමැතිය ලබාගැනීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි. |

| | | |
|---|---|---|
| | (iii) 9 පරිච්ඡේදයේ 9.14.1 වගන්තිය | මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් වන සියළුම කාරණා පිළිබඳව පනවනු ලබන රීති සහ රෙගුලාසි භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය සමග අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල යුතුය. කෙසේ වුවද, කාර්යාංශය මෙම අවශ්‍යතාවයට අනුකූලවීමට අසමත් වී තිබුණි. |
| (ඇ) | 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන චක්‍රලේඛයේ 4 පරිච්ඡේදයේ 4.2.1 (අ) සහ (ඇ) වගන්තිය. | ඉදිරි වර්ෂය සඳහා වූ සවිස්තරාත්මක සැලැස්ම සමග අවම වශයෙන් වසර තුනක් ආවරණය වනසේ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවද කාර්යාංශය එම අවශ්‍යතාවයට අනුව එවැනි සැලැස්මක් සකස් කර නොතිබුණි. |
| (ඈ) | 2008 ජනවාරි 11 දිනැති පීඊඩී/56 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ඉදිරි මාස 06 ක කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සැලකිල්ලට ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනවල අතිරේක මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද, කාර්යාංශය විසින් අතිරේක මුදල් ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබුණි. විගණනය විසින් කරන ලද ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂයේ අතිරේක මුදල් ප්‍රමාණය රු. මිලියන 1000 ක් පමණ විය. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දරන අංක අයිඑෆ්අයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | කාර්යාංශය සතු පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් චක්‍රලේඛයේ අවශ්‍යතාවය පරිදි පවත්වා නොතිබුණි. |
| (ඊ) | 2011 පෙබරවාරි 11 දිනැති පීඊඩී/57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | රු. 100,000 ඉක්මවන ඕනෑම පරිත්‍යාග / අනුග්‍රහ සඳහා ගරු මුදල් හා සැලසුම් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සියළුම රාජ්‍ය ව්‍යාපාර වල අවශ්‍යතාවයකි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුලදී ඉහත අනුමැතිය රහිතව රු. 1,128,000 ක් පෞද්ගලික ආයතන 2 කට පරිත්‍යාග කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු. 476,209,102 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 551,545,914 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 75,336,812 ක අඩුවීමක් දැක්වුණි. මුළු වියදම රු. 271,205,003 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි අඩුවීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ කාර්යාංශයේ ආදායම රු. මිලියන 1,444 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු. මිලියන 1,248 සමග සැසඳීමේදී සියයට 15.7 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එසේම ඉකුත් වර්ෂයේ වෙළඳ කටයුතු, අලෙවිකරණ සහ ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් වැය කර තිබුණු රු. මිලියන 697 සමඟ සැසැදීමේදී සමාලෝචිත වර්ෂය තුලදී ඒ සඳහා රු. මිලියන 968 ක් වැයකර තිබුණි. මේ අනුව සියයට 39 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

### 3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

-------------------------------------

සමහර වැදගත් අනුපාත පහත දක්වා ඇත.

| ස්කන්ධ අනුපාත | සම්මත අනුපාතය | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|
| ජංගම අනුපාතය | 2.1 | 2.84 | 3.28 | 2.47 |
| ක්ෂණික අනුපාතය | 1.1 | 2.83 | 3.25 | 2.45 |

4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

4.1 කාර්ය සාධනය

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී රු. මිලියන 876 ක් වෙළඳ කටයුතු සම්බන්ධ වියදම් වෙනුවෙන් දරා තිබුණි. කෙසේ වුවද සංචාරකයන්ගේ පැමිණීම බලාපොරොත්තු වූ පරිදි වැඩි වී නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| | 2012 | | 2011 | |
|---|---|---|---|---|
| රාජ්‍යය | දරන ලද මුළු වියදම | සංචාරකයන් පැමිණීමේ වර්ධනය | දරන ලද මුළු වියදම | සංචාරක පැමිණීමේ වර්ධනය |
| | රු. | % | රු. | % |
| එක්සත් රාජධානිය | 101,492,242 | 7.7 | 113,372,372 | 0.6 |
| ජර්මනිය | 39,246,721 | 28.2 | 43,302,313 | 22.2 |
| ප්‍රංශය | 20,545,444 | 16.8 | 20,016,035 | 55.6 |
| රුසියාව | 25,927,841 | 32.8 | 30,991,787 | 61.1 |
| නෙදර්ලන්තය | 4,044,308 | 11.6 | 7,186,800 | 34.2 |
| ඉන්දියාව | 9,812,701 | 2.9 | 835,974 | 35.1 |
| චීනය | 345,319,913 | 58.1 | 12,859,576 | 56.4 |
| ජපානය | 15,923,952 | 26.7 | 8,018,073 | 43.7 |
| මැදපෙරදිග රටවල් | 30,521,920 | - 0.3 | 14,153,406 | 53.2 |
| මලයාසියාව | නැත | 35.3 | නැත | 20.4 |
| ස්විස්සර්ලන්තය | නැත | 42.1 | නැත | 49.7 |

(ආ) මාධ්‍යකරුවන් පැමිණීමේ වැඩ සටහන් සහ සංචාරයන් සඳහා හුරු කිරීමේ වැඩ සටහන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී ඉහත වැඩ සටහන් සඳහා රු. මිලියන 26.43 ක වියදමක් දරා තිබුණි. කෙසේ වුවද, උපරිම ප්‍රතිලාභ රටට ලබාදීම පිණිස, සුදුසු සහ වාසිදායක මධ්‍යකරුවන් තෝරා ගැනීම මුල් කර ගත් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කල යුතු වැඩ සටහන් සංඛ්‍යාව සැලසුම් කර නොතිබුණි. මේ අනුව, විධිමත් මාධ්‍යය තෝරා ගැනීමේ සැලසුමකින් තොරව තත්කාර්ය පදනමකින් මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී මාධ්‍ය හුරු කිරීමේ සංචාරක 57 ක් සඳහා මාධ්‍යකරුවන් 183 ක් සහභාගි වී තිබුණි. එසේ වුවත්, අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකර ගැනීම පිණිස වැඩ සටහන් සඳහා මාධ්‍යකරුවන් තෝරා ගැනීමේ නිර්නායක තීරණය කර නොතිබුණි.

(iii) වැඩ සටහන් මගින් අපේක්ෂිත පරිදි මාධ්‍ය ප්‍රචාරයන් ඉටු කිරීම සම්බන්ධ සාක්ෂි විගණනයට නොලැබුණි.

4.2 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 45 කට වැඩි ප්‍රමාණයක් පුරප්පාඩු පවතී. සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ මානව සම්පත් සඳහා මුළු පිරිවැය පිළිවෙලින් රු. මිලියන 28.6 ක් සහ රු. මිලියන 25.8 ක් විය. එබැවින් සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ එක් සේවකයෙකු සඳහා වූ වියදම පිළිවෙලින් රු. 622,400 ක් සහ රු. 562,874 ක් විය.

(ආ) 2005 අංක 38 දරන සංචාරක පනතේ VII වගන්තියේ සඳහන් නියමයන් සැලකිල්ලට නොගෙන කාර්යාංශයේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි.

4.3 වාහන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී කුලියට ගත් වාහන දෙකක් සඳහා රු. 6,591,906 ක් ගෙවා තිබුණි. කුලියට ගත් වාහන සඳහා කි.මී. එකකට පිරිවැය රු. 56.32 ක් විය.

(ආ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුලදී කුලියට ගත් වාහන වල පිරිවැය රු. 4,237,828 කින් හෙවත් සියයට 180 කින් වැඩි වී තිබුණි.

5. ගිණුම්කටයුතු භාවය සහ යහ පාලනය
------------------------------------------

5.1 අයවැය ලේඛනමය පාලනය
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අයවැය ලේඛනයක් පිළියෙල කර තිබුණද,1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තියේ නියමයන් පරිදි මුදල් වර්ෂයට මාස තුනකට පෙරාතුව අයවැය ලේඛනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී විෂයයන් 22 ක අයවැයගත ප්‍රමාණය සහ තථ්‍ය ප්‍රමාණයන් අතර සියයට 7 සිට සියයට 1331 ක පරාසයක වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

6. පද්ධති හා පාලන
-------------------

මුදල් පනතේ 13(7) (අ) වගන්තිය යටතේ නිකුත් කරන ලද මාගේ සවිස්තරාත්මක වාර්තාව මගින් විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ප්‍රවර්ධන ක්‍රියාකාරකම්
(ඇ) අයවැය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) ප්‍රසම්පාදනයන්
(ඊ) අභ්‍යන්තර විගණනය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති.

srilanka

WONDER OF ASIA


**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය**

80, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකා

ක්ෂණික ඇමතුම්: 1912

ටෙලි: +94 11 2437059-60 / +94 11 2426800

වෙබ්: www.srilanka.travel

srilanka.travel/facebook


design & concept by tradlanka advertising